කොළඹ දිසා අධිකරණයේදීය

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු

නඩු අංකය:19849/එම්.ආර්.

එදිරිව

ගාමිණී ලක්ශමන් පීරිස්,
"විසුම්පාය",
ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02 සහ
37, කිරුළ පෙදෙස,
කොළඹ 05.

විත්තිකරු

සිවිල් නඩු විධාන සංග්‍රහයේ (95 වන වගන්තිය සමඟ කියවිය යුතු) 94 වන වගන්තිය යටතේ ඉහත නම සඳහන් විත්තිකරුගෙන් විචාරීම සඳහා "ඒ" යනුවෙන් ලකුණු කොට මෙයට අමුණා ඇති ආකෘතියේ ඇතුළත් වන විචාරණ අධිකරණය මාර්ගයෙන් යැවීම පිණිස අපට අවසර දෙන ලෙස ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමු. මෙම විචාරණවලට ඒවා භාරකරනු ලැබීමෙන් දින දහයක් තුළදී උත්තර සපයන ලෙස විත්තිකරුට නියම කරමින් ඔහුගේ ලේඛනගත නීතිඥවරයා මගින් ඒවා ඔහු වෙත භාරකරනු පිණිස අවසර දෙන ලෙසද ගෞරවයෙන් ඉල්ලමු.

තවද එකී විචාරණ ආපසු කැඳවීම සඳහා ඉතා ළඟ දිනයක් නියම කිරීමටද ගරු අධිකරණය කාරුණික වන ලෙස ඉල්ලා සිටිමු.

නීතිඥවරුන්

තවදුරටත් අප අයැද සිටින්නේ, මෙම නඩුවේදී ගොනුකර ඇති උත්තරයෙහි පැමිණිල්ලේ සම්ප්‍රකාශවල සඳහන් ලේඛනවල අන්තර්ගත කරුණුවලට යටත්ව පැමිණිල්ලේ සම්ප්‍රකාශ ගණනාවක්ම ප්‍රතික්ෂේප කර ඇති බවය. එසේ ප්‍රතික්ෂේප කර ඇති පැමිණිල්ලේ අදාල සම්ප්‍රකාශවල, එම ලේඛනවල ඇතුළත් කරුණුවලටම යොමුකිරීම් කර තිබියදී වන අතර, මේ නඩුවේ පාර්ශවකරුවන් අතර පවත්නා නියම ප්‍රශ්න සම්ප්‍රකාශවල ඇතුළත් කරුණු නොදන්නා බව අයැද සිටීම නිසා, මේ නඩුවට සම්බන්ධවන සියලු ප්‍රශ්න සවල ලෙස හා සම්පූර්ණයෙන්ම විනිශ්චය කිරීමට ගරු අධිකරණයට හැකිවනු පිණිස, විචාරණ මගින් විත්තිකරු විචාරීම නොකර පාර්ශවකරුවන් අතර වූ නියම ප්‍රශ්න පහසුවෙන් මතුකර ගත නොහැක.

තවද පැමිණිලිකරුගේ අධිනීතිඥවරයාට මෙම මෝසම තහවුරුකර සිටීමට හැකිවනු පිණිස මෙම නඩුව 1998 පෙබරවාරි මස 24 වන දින කැඳවන ලෙසද අපි අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

1998 ක්වූ පෙබරවාරි මස 23 වන දින කොළඹ දීය.

පැමිණිලිකරුගේ නීතිඥවරුන්

"ඒ"

කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්.ආර්.
ස්වභාවය : මුදල

එදිරිව

ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
විසුම්පාය,
ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02, සහ
37, කිරුළ පෙදෙස,
කොළඹ 05.

කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු.300,000,000/-

විත්තිකරු

ඉහත නම සඳහන් විත්තිකරු වෙතය,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 95 වන වගන්තිය යටතේ, ඔහුගේ ලේඛණගත නීතිඥවරුන් වන, කොළඹ 7 ග්‍රෙගරීස් පාරේ අංක.59 හි පෝල් රත්නායක ඇසෝෂියේට්ස් මගින් භාර දීම පිණිසයි.

ඉහත නම සඳහන් විත්තිකරුගෙන් විචාරීම සඳහා ඉහත නම සඳහන් පැමිණිලිකරු වෙනුවෙන් විචාරණ :

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් විචාරණ ඔබ වෙත භාර දී දින දහයක් ඇතුළත ඒවාට පිළිතුරු දීමට ඔබට නියම කරනු ලැබේ.

පැමිණිල්ලේ/

<u>පැමිණිල්ලේ 2 වැනි ඡේදය සම්බන්ධයෙන් උත්තරයේ 10 වැනි ඡේදයේ සම්ප්‍රකාශයන්ට අදාළව :</u>

1. (අ) එවකට ඔබ සාමාජිකයෙකුව සිටි (මෙහි මින්මතු "සෙක් ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුරැකුම්පත් සහ විනිමය කොමිෂම වෙත සහ/හෝ ඔබ වෙත, පැමිණිලිකරු වෘත්තීය ගණකාධිකාරීවරයකු ලෙස විස්තර කරමින්, පැමිණිලිකරුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා නීතිඥ මහතුන් විසින් ලියා යවනු නොලැබුවේද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර රාජිත සේනාරත්න මහතා විසින් 1995 මාර්තු 22 වන දින හෝ ඊට ආසන්න දිනකදී පැමිණිලිකරු හා සම්බන්ධව මතු කළ කාරණයක් මත ඔබ පිළිතුරු නොදුන්නේද?

(ii) "මොවුන් මෙම සභා ගැබේදී උත්තර දීමට අයිතියක් නොමැති නිලධාරීන් වන බැවින්, නිහාල් අමරසේකර මහතා පිළිබඳව කියන්නට යෙදුනු දේ ගැන යොමු කිරීම හරි බවද මම සිතමි. ස්වභාවික යුක්ති ධර්මය උල්ලංඝනය වීමක් ඒ හේතුවෙන් සිදුවනු ඇත" යනුවෙන් 1995 මාර්තු 22 වන දින ඔබ පාර්ලිමේන්තුවට දුන් පිළිතුරේ, වෙනත් දේ අතර, ඔබ ප්‍රකාශ නොකළේද?

(ඇ) 1994 සැප්තැම්බර් මාසයේ දී මුදල් අමාත්‍යාංශයේ උපදේශකවරයකු වශයෙන් පැමිණිලිකරු පත් කිරීමට යෙදුන විට, ඔබ, නියෝජ්‍ය මුදල් ඇමතිවරයා ලෙස සිටි බැවින් මෙන්ම ඔබ කැබිනට් අමාත්‍යවරයකුව සිටියදී ඔහුගේ එම පත්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි පැමිණිලිකරුගේ වෘත්තීය පසුබිම ගැන සහ ඔහු දරණ තත්වය පැහැදිලිව දක්වා සඳහන් කරනු ලැබිය යුතුව තිබුණු නිසා, ඔබ ඒ ගැන නොදැන සිටිය හැක්කේ කෙසේද?

<u>පැමිණිල්ලේ 3 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 11 වන ඡේදයේ සම්ප්‍රකාශවලට අදාළව :</u>

2. (අ) ඔබ පසුගිය ආණ්ඩුව සමග සමීප සබඳතාවයක් නොපැවැත්වූයේ නම්, එය යටතේ ඔබ විසින් දේශපාලන පත්වීම් ගණනාවක් දරන ලද්දේ කෙසේද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතාට පසුගිය ආණ්ඩුවට පිල් මාරු කිරීම පිණිස උපදෙස් දීමට සහ/හෝ ඔහු ඒ සඳහා උනන්දු කරවීමට ඔබ ඒ මහතාගේ රොස්මිඩ් පෙදෙසේ නිවසට නොගියේද?

(ඇ) (i) පිළිගෙන ඇති පරිදි පසුගිය රජය කාලයේ ඔබ උප සභාපතිවරයාව සිටි ජනසවිය භාර අරමුදල ගැන පරීක්ෂා කර බැලීම පිණිස ජනාධිපති කුමාරණතුංග මැතිණිය විසින් ජනාධිපති නීතිඥ ජී.ඒ.ඩී සමරසේකර මහතාගේ සභාපතිත්වයෙන් යුත් ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවක් පත් කරනු නොලැබීද?

(ii) වෙනත් දේ අතර, දුප්පත්කම තුරන් කිරීම සඳහා අදහස් කරගෙන තිබූ මුදල් විශාල පරිමාණයෙන් පසුගිය රජයේ දේශපාලන කාර්යයන් සඳහා භාවිතා කර තිබුණු බව එම කොමිසම විසින් කරනු ලැබූ නිගමනය, 1996 මැයි මස 26 වන දින "සන්ඩේ ඔබ්සවර්" පත්‍රයේ විශාල ප්‍රමුඛත්වයක් දී වාර්තා කරනු නොලැබුවේද?

(iii) ජනසවිය භාර අරමුදලේ මුදල් කමිටුවේ රැස්වීම් වල මූලසුන ඔබ විසින් හොබවන නොලැබුවේද? නොඑසේ නම්, එය දරන ලද්දේ කා විසින්ද? ඔබ ඒවාට සහභාගී නොවුයේද?

(ඈ) අභාවප්‍රාප්ත ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ හදිසි නීති නියෝග සකස් කිරීම සහ අනුමත කිරීම පිණිස වූ කමිටුවක, ඔබ මූලසුන හෙබවූයේ නැද්ද? නොඑසේ නම්, එසේ කළේ කවුරුද? ඔබ ඒට සහභාගී නොවූයේද?

පැමිණිල්ලේ 4 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 12 වන, 13 වන හා 14 වන ඡේදවල සම්ප්‍රකාශ වලට අදාළව :

3. (අ) ව්‍යුත්පන්න නඩුවක් ලෙසින් කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන නඩුව සහ එහි අන්තර්ගත කරුණු ඔබ විසින් පිළිගෙන තිබියදීම, අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කරමින්, උගත් දිසා විනිසුරුතුමා විසින් කරන ලද අහිතකර නිරීක්ෂණ ඔබ පිළිගනු නොලබන්නේ මන්ද?

(ආ) ඔබ එවකට "සෙක්" ආයතනයේ සාමාජිකයෙකු වශයෙන්, මෙහි ඉහත අංක.5 දරණ විචාරණයෙහි ඔබා මැනවින් දක්වා ඇති පරිදි, ඔබටත්, සෙක් ආයතනය වෙනත්, වෙනත් දේ අතර අදාළ වන්නා වූ සිද්ධාන්ත සහ ලේඛණ ඇතුළුව එකී දිසා අධිකරණයේ නියෝගවල පිටපත් ඉදිරිපත් කරමින්, එම නියෝග එම ආයතනය සහ ඔබගේ දැනගැනීමට සැලසූ බව ඔබ පිළිනොගන්නේද?

<u>පැමිණිල්ලේ 5 වන, 6 වන හා 7 වන ඡේද සම්බන්ධයෙන් වූ උත්තරයේ 15 වන ඡේදයේ සම්ප්‍රකාශවලට අදාළව</u> :

4. (අ) එකී කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරන නඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනාධිපති නීතිඥ කේ.එන්, චොක්සි මහතා වැරදි ක්‍රියා කළ තැනැත්තෙකු ලෙස, එකී වැරදි ක්‍රියා ද සඳහන් කරමින් විත්තිකරුවකු ලෙස නම් කර තිබියදීත් සහ ඔබ විසින් ඒ අතරතුරදී, එකී නඩුවේ අන්තර්ගත කරුණු පිළිගෙන තිබියදීත්, කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරණ නඩුවට අදාළව,එකී පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතාගේ ක්‍රියා කළාපය ගැන ඔබ නොදන්නේ යයි ඔබ කියන්නේ කෙසේද?

(ආ) එකී පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි මහතාද ඇතුළුව (මෙහි මින් මතු "එච්ඩීඑල් සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම නිසා, පැමිණිලිකරුට 1990 සැප්තැම්බරයේදී ඔබ විසින් පිළිගෙන ඇති පරිදිම, ව්‍යුත්පන්න නඩුවක් පැවරීමට අනිවාර්යයෙන්ම සිදුවූ බව ඔබ පිළිගන්නෙහිද?

(ඇ) ඔබ එවකට "සෙක්" ආයතනයේ සාමාජිකයෙකුව සිටියදී, වෙනත් දේ අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥාවේ පිටපතක් ද ඉදිරිපත් කර සිටිමින්, පැමිණිලිකරු සහ/හෝ ඔහුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් විසින් විශේෂයෙන්ම එකී කාරණා "සෙක්" ආයතනයේ දැනගැනීමට සලස්වා ඇති බව ඔබ පිළි නොගන්නේද?

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතා විසින්, රජය විසින් බහුතර අයිතියක් දරූ එච්ඩිඑල් සමාගමේ අධ්‍යක්ෂක ධූරයක් දරමින්, රජය සමග කොන්ත්‍රාත්තුවක්ද ඇතිව සිටීම, රජයේ ඇපකරයන්ට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීම, ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 91 (i) (ඉ) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව ඔබ නොපිළිගන්නේද? එසේ නම් ඒ මන්ද?

(ඉ) (i) පැමිණිලිකරු සහ/හෝ ඔහුගේ නීතිඥයන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් විසින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමෙන් ඔබ සහ "සෙක්" ආයතනයේ එවකට සිටි සමාජිකයන් වළක්වාලන ලද්දේ, වෙනත් කැනැත්තන් අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතාගේ සම්බන්ධ වීම සහ හවුල්කාරත්වය බව ඔබ පිළි නොගන්නේද?

(ii) නැසී ගිය ප්‍රේමදාස ජනාධිතුමාගේ සමීප විශ්වාසවන්තයකු වශයෙන්, ඔබ එවකට දේශපාලන පත්වීම් ගණනාවක්ම දරූවේ නැද්ද?

(ඊ) කුමාරණතුංග ජනාධිපතිනිය විසින් පත් කරන ලද විශේෂ ජනාධිපති කොමිසමක් විසින් පරීක්ෂා කර බැලීමට පාත්‍ර වූද, ජනමාධ්‍ය විසින් පුළුල් ලෙස ප්‍රචාරය කරනු ලැබූවාවූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතාගේ එකී ක්‍රියා කලාපය ගැන, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සිටින ඔබ දැන නොගෙන සිටිය හැක්කේ කෙසේද?

(ඈ) බැලු බැල්මටම වංචාවක් නිරූපිත නඩුවක් ලෙසට පැමිණිලිකරුගේ නඩුව පිළිගනිමින් 1992 දෙසැම්බර් මාසයේදී දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව මත පවා එවකට සිටි එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම හේතුකොට ගෙන, මෙම කාරණය පරීක්ෂා කර බැලීමට විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීමට යෙදුන බව ඔබ පිළිනොගන්නේද ?

(ඉ) මූලික පරීක්ෂණයකින් පසු, විශේෂ ජනාධිපති කොමිසන් සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතා වෙත, ඉහතකී ක්‍රියා කලාපයේ පදනම මතම, නිදහසට හේතු දක්වනු ලෙස නියම කරමින්, ජනමාධ්‍ය මගින් පුළුල් ලෙස වාර්තා කරන ලද, නොතීසියක් නිකුත් කරන ලද බව සහ ඔහු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනලද ලිඛිත සැලකිරීම්වල වැරදි ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ඔහු දෝෂයට ලක් කරන ලද බවත් ඔබ පිළිනොගන්නෙහිද? එසේ නම්, ඒ කෙසේද?

<u>පැමිණිල්ලේ 8 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 16 වන ඡේදයේ සම්ප්‍රකාශ වලට අදාලව</u> :

5. (අ) සෙක් ආයතනයේ රීති මගින් පාලනය වනු ලබන බව ඔබ විසින් පිළිගෙන ඇති,එච්ඩීඑල් සමාගමේ,වෙනත් දේ අතර, කටයුතු පවත්වා ගෙන යෑම සම්බන්ධයෙන් සෙක් ආයතනය වෙත කරන ලද පැමිණිලිවල කරුණු මත පැමිණිලිකරු සහ/හෝ ඔහුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් විසින්, 1991.08.15, 1991.09.27, 1991.10.10, 1991.10.16, 1991.10.17, 1991.10.23, 1991.11.08, 1991.11.23, 1991.12.28, 1992.03.25, 1992.08.04, 1992.09.02, 1992.09.27, 1992.12.29, 1993.02.17, 1993.08.05, 1993.10.07, 1994.02.17, 1994.02.23, 1994.03.09, දිනයන් දරණ ලිපි ඉදිරිපත් කරන ලද බව ඔබ පිළිනොගන්නෙහිද?

(ආ) ඔබ විසින්ම පිළිගෙන ඇති පරිදි, 1987.10.23 වන දින සිට 1994.03.31 දින දක්වා ඔබ සෙක් ආයතනයේ සාමාජිකයකුව සිටියදී එකී ලිපි සෙක් ආයතනය වෙත යවන ලද බව ඔබ පිළිනොගන්නෙහිද?

(ඇ) එයට අතිරේක වශයෙන් 1991.10.10, 1991.11.08, 1991.11.23, 1991.12.28, 1992.08.04, 1992.09.27, 1993.10.07, දිනයන් දරන ලිපිවල පිටපත්, ඔබටද ඇතුලුව සෙක් ආයතනයේ සාමාජිකයින් එක් එක් අයෙකු වෙත යවා ඇති බව ඔබ පිළිනොගන්නේද?

(ඈ) එකී ලිපි මගින්, එකී කොළඹ දි.උ. අංක.3155/විශේෂ දරණ නඩුවට අදාළ ලේඛන සහ එහි නිකුත් කරණු ලැබූ නියෝග/නඩු තීන්දුව, එහි සමාජිකයකු වශයෙන් ඔබටද ඇතුලුව, සෙක් ආයතනය වෙත ඉදිරිපත් කරන ලද බව ඔබ පිළිනොගන්නෙහිද?

(ඉ) එකී ලිපි, එච්ඩ්එල් සමාගමේ 1990.03.31 දිනට වූ වාර්ෂික ගිනුම් වලට අදාල කොළඹ දි.උ. අංක.3231/විශේෂ දරණ නීතියෙන් තමන් ව්‍යුත්පන්න නඩුවකටද අදාළ වූ බවත් එම නඩුවේ ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණය විසින් එම ගිණුම් වාරණය කරන ලද බවත් ඔබ පිළිනොගන්නෙහිද?

(ඊ) ඔබ විසින් පිළිගෙන ඇති පරිදිම, එච්ඩ්එල් සමාගමේ කටයුතු පවත්වාගෙන යාමත් සහ එහි වාර්ෂික ගිණුම්, සංශෝධිත පරිදි වූ 1987 අංක.36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනතේ විධිවිධාන පරිදි සෙක් ආයතනයේ විෂය පථය තුළට ගැනෙන බව සහ එහි ඊනී මගින් පාලනය වන බව ඔබ පිළිනොගන්නෙහිද?

(උ) ඔබ විසින් පිළිගෙන ඇති පරිදිම, එවකට ඔබ සෙක් ආයතනයෙහි සාමාජිකයෙකුව සිටියදී, ඉහතකී ලිපිවලට පිළිතුරු වශයෙන් සෙක් ආයතනය විසින් පැමිණිලිකරු සහ/හෝ පැමිණිලිකරුගේ නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා මහතුන් වෙත, 1991.09.20, 1991.10.09, 1991.12.03, 1992.08.26, 1992.09.28, 1993.01.05, 1993.03.08, 1993.08.12, 1993.10.22, සහ 1994.02.24, දිනයන් දරන ලිපි එවා ඇති බව ඔබ පිළිනොගන්නෙහිද?

(ඩ) එකී ලිපිවල, වෙනත් දේ අතර සෙක් ආයතනය විසින් පහත දැක්වෙන කරුණු සඳහන් කර ඇති බව ඔබ පිළිනොගන්නෙහිද?

(i) "යොමු කරන ලද ඔබගේ ලිපිය, මෙන්ම ඔබ විසින් කලින් එවා ඇති ලිපිද කොමිෂම විසින් අධ්‍යයනය කරන ලද අතර ඒවායේ අන්තර්ගත කරුණු සැලකිල්ලෙන් සටහන් කර ගන්නා ලදී". (1991.12.03 දිනැති ලිපිය)

(ii) "මෙය ලියනුයේ, ඔබගේ 1992 අගෝස්තු 4 වන දින දරණ ලිපිය ලැබුනු බව සහ ඔබගේ ලිපියෙහි සඳහන් වන ඔබගේ සේවාදායකයාවූ නිහාල් ශ්‍රී අමරසේකර, එෆ්.සී.ඒ., එෆ්.සී.එම්.ඒ. මහතාගේ ලිපි වලින් මතු කරන ලද ප්‍රශ්න නිරතුරුවම කොමිෂන් සභාව විසින් කරන ලද තීරණ මත පදනම් වී ඇති බව ඔබට දැන්වීමටය". (1992.08.26 දිනැති ලිපිය)

(iii) "ඒට අමුණා තිබූ අභියාචනා අධිකරණ අභියාචනා අංක. 33, 34/94 දරන නඩුවේ තීන්දුවෙහි අන්තර්ගත කරුනු කොමිෂන් සභාව විසින් සැලැකිල්ලට ගෙන තිබූ බවට ඔබ වෙත සහතික වන බව කරුණාවෙන් සලකන්න". (1993.01.05 දිනැති ලිපිය)

(iv) "ඉහත සඳහන් කරන ලද ලිපියේ අන්තර්ගත කරුණු සුරැකුම්පත් සහ විනිමය කොමිසන් සභාව විසින් සලකා බලා ඇත". (1993/08/12 දිනැති ලිපිය)

(v) ඔබගේ එහි සඳහන් ලිපියේ සඳහන් කර ඇති නිශ්චිත කරුණු ගැන කොමිෂන් සභාව විසින් නොබෝ දිනකින් ප්‍රතිචාරයක් දක්වනු ඇත". (1993/10/22 දිනැති ලිපිය)

(එ) එමනිසා ඉහත කී කාරණා ගැන ඔබ ඉතා මනා ලෙස දැන සිටියේය යන්න බව ඔබ පිළිනොගන්නේද? එසේ නැතිනම් ඒ මන් ද?

(ඒ)/

(ඒ) එමනිසා, පැමිණිලිකරු විසින්, වෙනත් දේ අතර, 1992 අගෝස්තු මස 04 වන දිනැති ලිපියේ වඩාත් සම්පූර්ණ ලෙස දක්වා ඇති පරිදි සෙත් ආයතනය වෙත පැමිණිලි ගණනාවක් කර ඇති බවත්, එහෙත් ඔබ ද, ඇතුළු එහි සාමාජිකයන් වෙත ඒවා සම්බන්ධයෙන් නිශ්චිත ලෙස දැනුම් දී තිබියදීත් ඒ පැමිණිලි ගැන කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනීම ඔවුන් විසින් පැහැර හැර සහ අතපසු කර ඇති බවත්, සඳහන් වන පැමිණිල්ලේ 8(ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සම්ප්‍රකාශ ඔබ දැඩිලෙස ප්‍රතික්ෂේප කරන්නේ මන්ද?

(ඔ) මීට අමතරව, පැමිණිලිකරු විසින්, 1992/08/31 දින හා 1994/05/06 දින දරණ ලිපි විශේෂයෙන් ඔබ වෙත ලියාපදිංචි තැපෑලෙන් අමතන ලද බව පිළිනොගන්නේ ද?

(ඕ) ඔබ නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී -

(i) මුදල් ඇමති විසින් එකී කාරණය සමාලෝචනය කරන ලදුව සෙත් ආයතනය විසින් සුදුසු ප්‍රතිකර්ම ගත යුතු බවට විධාන කර ඇති බව සඳහන් කරමින්, මේ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා මෙන් සෙත් ආයතනයට නියම කරමින්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994/09/23 වන දින දරණ ලිපිය සෙත් ආයතනය වෙත යවා ඇති බව ;

(ii) එසේ කිරීමට භාර ගනිමින්, සෙත් ආයතනයේ සභාපතිවරයා විසින් 1994/10/06 දින දරණ ලිපිය මගින් ඊට පිළිතුරු දුන් බව ;

ඔබ පිළිනොගන්නෙහිද?

(ක) හිල්ටන් සමථ ගිවිසුම්වල තත් කාරණය සම්බන්ධයෙන් නිශ්චිත කොන්දේසියක් ඇතුළත් කිරීම මාර්ගයෙන්, ව්‍යවස්ථාමය රාජකාර්යයන් හිතාමතාම පැහැර හැරීම සහ අතපසු කිරීම සඳහා වෙනත් තැනැත්තන් අතරෙහි ඔබට ද, විරුද්ධව රජය විසින් ක්‍රියාකළ යුතුව තිබෙන බව එවකට සිටි නීතිපතිවරයා වූ ජනාධිපති නීතිඥ තිලක් මාරපන මහතා විසින් සහ එවකට සිටි අතිරේක සොලිසිටර් ජනරාල් (දැන් ජනාධිපති නීතිඥ) ශ්‍රීනාත් පෙරේරා මහතා නිගමනය කළ බව ඔබ පිළිනොගන්නෙහිද?, ඉන් අනතුරුව, සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්න මහතා ද, ඊට එකඟත්වය පළ කල බව ඔබ පිළිනොගන්නේද?

<u>පැමිණිල්ලේ 9, 10, 11 දරණ ඡේද සම්බන්ධයෙන් වූ උත්තරයේ 17 වන ඡේදයේ සම්ප්‍රකාශ වලට අදාළව</u> :

6. (අ) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ 1 සිට 4 දක්වා අංක යෙදූ හිල්ටන් සමථ ගිවිසුම් ඔබ විසින් සවිස්තරාත්මකව පරීක්ෂා නොකළේ ද?

(ආ) ඒ අනුව, සමථය ගිවිසුම් හී, නිශ්චිත වගන්තියකින් එහි පූර්ණත්වයට අවශ්‍ය වන්නා වූ කොටසක් අත්හැර, ඉන් කොටසක් පමණක් පද සම්බන්ධතාවයෙන් තොරව උපුටා දක්වමින්, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී ඔබ ප්‍රකාශයක් කරනු ලැබුවේ නැද්ද ? එමගින් එය පාර්ලිමේන්තුවට සහ එමගින් මහජනතාවට අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශයක් නොවන්නේද? එසේ නොවන්නේ නම්, ඒ මන්ද?

(ඇ) එබැවින්, මේ නඩුවෙහි ඔබගේ උත්තරය 1997 ඔක්තෝබර් 31 වන දින ගොනු කිරීමට කලින්, ඔබ විසින් එකී සමථ ගිවිසුම් පරීක්ෂා කර බැලීමට නොයෙදුණේද?

(ඈ)/

(ඈ) සමථ ගිවිසුම්වල, විශේෂයෙන්ම ඔබ විසින් එලෙස නොමග යවන සුළු අන්දමින් සඳහන් කරන ලද අංක .3 දරණ ගිවිසුමෙහි පූර්විකාවෙහි, ජපන් සමාගම්වල ඉල්ලීම පිට, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එවැනි සමථයක් ඇතිකර ගැනීමේ අදහසින් පැමිණිලිකරු සමග සාකච්ඡා කිරීමට ඉදිරිපත් වූ බව සඳහන් කර ඇති බව ඔබ පිළිනොගන්නෙහිද? නොඑසේ නම්, එකී පූර්විකාවෙහි සඳහන් කර ඇත්තේ කෙසේද? එසේ නම්, එය කෙසේද?

(ඉ) එකී අංක .3 දරණ එම ගිවිසුමෙහි ම, වෙනත් දේ අතර -

(i) 1992 දෙසැම්බර් මස 02 වන දිනට සහ ඉන්පසු 1994 සැප්තැම්බර් මස 30 වන දින දක්වා එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයන් ලෙසින් සිටි තැනැත්තන් බැහැර කොට එහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම ;

(ii) දැනට සිටින එච්ඩීඑල් සමාගමේ විගණකවරුන් ඉවත් කිරීම ; 1990 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන එච්ඩීඑල් සමාගමේ ගිණුම් නැවත සකස් කිරීම ;

(iii) පැමිණිලිකරු විසින් ඒ කෘත්‍ය ඉදිරියටත් කරගෙන යාමට තමාට ඇති අයිතිය එසේම තබා ගන්නා අතරම, පැමිණිලිකරු විසින් කරන ලද නියෝජන මත, සෙත් ආයතනයේ සාමාජිකයන්ගේ එකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් හා ක්‍රියා සම්බන්ධයෙන් ඔවුනට විරුද්ධව ක්‍රියා මාර්ගයක් ගැනීම ;

රජය විසින් කරනු ලබන සහ කල යුතු බවටත්, කොන්දේසි අන්තර්ගතව තිබුනු බව ඔබ පිළිනොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඊ) /

(ඒ) මුදල් අමාත්‍යවරයා විසින් 1995 ජූනි මස 21 වන දිනට කලින් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු පැහැදිළි කර තිබුණු අතර, 1995 ජූනි මස 28 වන දින හෝ ඊට ආසන්න දිනකදී අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද එකී හිල්ටන් සමථය පිළිබඳ 1995 ජූනි මස 21 වන දින දරණ කැබිනට් සන්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බව ඔබ පිළිගොගන්නේද?

(ඍ) ලියා අත්සන් කිරීමට නියමිත සමථ ගිවිසුම් සොලිසිටර් ජනරාල්වරයා විසින් නිමකර තිබෙන බවත්, එකී සමථය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් විශේෂ ජනාධිපති කොමිෂන් සභාව දැනුවත් කර ඇති බවත්, එකී කැබිනට් සන්දේශයෙහි සඳහන් කර ඇති බව ඔබ නොපිළිගන්නෙහි ද?

(ඎ) එකී අමාත්‍ය මණ්ඩල සන්දේශයෙහි, වෙනත් දේ අතර, එකී සමථයේ මූල්‍ය නියමයන්, විශේෂයෙන්ම :

(i) ජපන් යෙන් මිලියන 13,476 ක (ශ්‍රී ලංකා රුපියල් මිලියන 7816 ක) පොලියක් කපා හැරීම ;

(ii) ජපන් යෙන් මිලියන 4110 ක් (ශ්‍රී ලංකා රුපියල් මිලියන 2384) වන, මුල් මුදලින් 30% ක් කපා හැරීම ;

(iii) ජපන් යෙන් 17,586 ක (ශ්‍රී ලංකා රුපියල් මිලියන 10,200) මුළු කපා හැරීම ; (දණ්ඩන පොලිය හැර 55.4%) ක 63.3% ක මුළු කපා හැරීම ;

(iv) පැමිණිලිකරු විසින් ලබා ගන්නා ලද අතුරු ඉන්ජන්ෂන් නියෝගවල ප්‍රතිඵලයක් වශයෙන්, එච්චිචල් සමාගමේ පොලියද සමග එකතු වී ඇති මුළු මුදල අඩු කිරීමෙන් පසු, ජපන් යෙන් මිලියන 7834 ක් (ශ්‍රී ලංකා රුපියල් මිලියන 4544) (ජපනුන් විසින් ඉල්ලා සිටි මුළු මුදලින් 28.2%) වර්ෂයකට 5.25% බැගින් වූ අඩුකළ පොලී අනුපාතයක් අනුව, වර්ෂ 2010 දක්වා ප්‍රතිලේඛනගත කිරීම ;

ගෙන හැර දක්වා තිබුනු බව ඔබ පිළිනොගන්නේද?

(එ) මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සහ විමර්ශන අධ්‍යක්ෂවරයා විසින් හරි-වැරදි බලා සහතික කරන පරිදි, පැමිණිලිකරු විසින් දරන ලද වියදම් ඔහුට ප්‍රතිපූරණය කිරීම එකී අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමත නොකළේද ? 1995 අගෝස්තු මස 08 වන දින ඔබ විසින් පාර්ලිමේන්තුවට කරන ලද ඉහත කී ප්‍රකාශයේදී එය ඔබ විසින් පිළිනොගන්නේද?

(ඒ) තවද, මූල්‍ය/වෙළඳ බැංකු ආයතනයක් විසින් තීරණය කරනු ලැබිය යුතු, පැමිණිලිකරුගේ වෘත්තීයමය කාලය සහ ප්‍රයත්න සඳහා සාධාරණ වන්දියක් ගෙවීම එම අමාත්‍ය මණ්ඩල සංදේශයෙන්ම අනුමත කළ බව ඔබ පිළිනොගන්නෙහිද? නොඑසේ නම්, ඒ ඇයි?

(ඔ) එකී අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි, වෙනත් දේ අතර, මෙසේ සඳහන් කර තිබුණු බව ඔබ පිළිනොගන්නෙහිද? එසේ නම්, ඒ කෙසේද?

(i) ඉනික්ඛිති 1992 දෙසැම්බරයේදී අග්‍ර විනිශ්චයකාරතුමා විසින් මූලසුන දැරූ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දිසා අධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග ස්ථිර කර සිටින ලදී. ඒ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින්, "බලවත් විත්තිවාචකයක් ඉදිරියෙහි පවා, අමරසේකර මහතා විසින් සාධාරණ වූද, සාර්ථකත්වය පිළිබඳ යථාර්ථ බලාපොරොත්තුවක් සහිත වූද, බලගතු බැලූ බැල්මට පෙනෙන නඩුවක් තහවුරු කර ඇති බවත්, අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග නිකුත් කරනු ලැබ ඇත්තේ අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වතු ලෙස මෙරටින් වෙන'තකට හැරවීම සඳහා බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී."

(ii) "ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය නඩු තීන්දුවෙහි වෙනත් දේ අතර, තවදුරටත් විශේෂයෙන්, සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, ආණ්ඩුව බහුතර කොටස්හිමියා සහ ඇපකරු වන බැවින්, මෙය, මූළුමනින්ම රජයට දැක් වූ උදාසීනත්වය පිළිබඳ කාරණයක් විය නොහැකිය. දක්වා ඇති කරුණු අනුව, ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබුනේ රාජ්‍ය අරමුදල් මත බර පැටවීමක් වන රජය විසින් ඇප වූ විශාල ප්‍රමාණයේ ණය සහිත වූද, රජය විසින් අයිතිය දරන්නා වූද, එකී සමාගම වෙනුවෙන් ක්‍රියා කරමින් තනි කොටස්හිමියකු වශයෙන්, සාමාන්‍ය පුරවැසියකු වූ අමරසේකර මහතා විසින් නොව, රජය විසින් මය".

(ඕ) (i) ඔබ විසින් 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි, පැමිණිලිකරු විසින් හිල්ටන් හෝටල ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට යෙදුනු සංසන්දනාත්මකව නොවැදගත් නඩු කිහිපයක් ගැන ඔබ විසින් විශේෂයෙන් සඳහන් කර තිබුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? ඒ නඩු පැමිණිලිකරුට විරුද්ධව පැවරීමට තුඩු දුන් නිශ්චිත ආකාරය සහ පැමිණිලිකරුට සහාය වීමට ආණ්ඩුව බන්ධනය වූයේ කුමක් නිසාද යන වග සඳහන් වන ඒ ඡේදයේ ඊට අදාළ කොටස ඔබ විසින් හිතාමතාම යටපත් කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එමගින්, මත භේදයක් ඇති නොවූයේද?

(ii) එමගින් හබයක් ඇති කරමින්, මහජනතාවගේ ඇස් ඉදිරිපිට පැමිණිලිකරු ලජ්ජාවට පත් නොකරන ලද්දේද? නොඑසේ නම්, එසේ නොවන්නේ කෙසේද?

<u>පැමිණිල්ලේ 12 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 18 වන ඡේදයට අදාළව.</u>

7. (අ) ජනාධිපති කුමාරතුංග මැතිණිය විසින් 1995 පෙබරවාරි මස 07 වන දින හෝ ඒ ආසන්නයේදී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අධිකාර පත්‍රය, සංශෝධිත පරිදි වූ 1978 අංක.4 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ හා ඒ අනුව නිකුත් කරන ලද්දක් බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ආ) එකී අධිකාර පත්‍රයේ උපලේඛනයේ අංක.2 විෂය වශයෙන් "එච්.ඕ.එල්.සමාගම - හිල්ටන් හොටේල් ව්‍යාපෘතියට අදාළ කාරණා සහ ඒ සම්බන්ධයෙන් රජයේ සහ පොදු ආයතන විසින් කරන ලද සහ නොකර හරින ලද ක්‍රියා" යන්න තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඇ) අධිකරණ අමාත්‍යවරයා ලෙස ඔබ ප්‍රමුඛතාවයක් වශයෙන්, එකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට එසේ නිකුත් කරන ලද එකී අධිකාර පත්‍ර සකස් නොකලේද ?

(ඈ) එකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව එකී පළමුවන පරීක්ෂණ අංක.1/95 වශයෙන් එකී හිල්ටන් හෝටලය පිළිබඳ කාරණය පරීක්ෂණයට ගන්නේ ලද්දේ ඔබේ ඉල්ලීම මත බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඉ) 1978 අංක.4 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ, වෙනත් දේ අතර, බලතල වැරදිලෙස පාවිච්චි කිරීම හෝ අනිසිලෙස භාවිතා කිරීම පිළිබඳව, බලපෑම, අයුතු මැදිහත්වීම, වංචාව සහ ඥාති සංග්‍රහය පිළිබඳව පරීක්ෂා කිරීමට කොමිෂන් සභාවට බලය ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඊ)/

(ඍ) බලය වැරදිලෙස පාවිච්චි කිරීම හෝ අනිසිලෙස භාවිතා කිරීම පිළිබඳව සහ/හෝ දූෂණය සහ/හෝ වංචනික ක්‍රියාවන් සිදු කිරීම පිළිබඳව වරදකරුවන් නොකළ යුත්තේ මන්ද යන්නට හේතු දක්වන ලෙසට වූ හේතු දැක්වීමේ දැන්වීම්, චෝදනා කීපයක් දක්වමින්, ජනාධිපති නීතිඥ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි මහතා ඇතුළුව එච්.ඕ.එල්.සමාගමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුට නිකුත් කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද ? එසේ පිළිගන්නේ නැත්නම්, ඔවුන්ගෙන් හේතු පෙන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබුවේ කුමකට වැරදිකරුවන් නොවීම සඳහාද ?

(ඉ) එකී හේතු පෙන්වීමේ දැන්වීම් මාධ්‍යවල, විශේෂයෙන් කේ.එන්.චොක්සි මහතාට නිකුත් කරන ලද දැන්වීම 1996 පෙබරවාරි මස 29 වන දින "අයිලන්ඩ්" පුවත්පතේ එකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉල්ලීම පිට ප්‍රසිද්ධ නොකළේද ? එසේ නම් එකී හේතු පෙන්වීමේ දැන්වීම්වල අඩංගු දේ ගැන ඔබ නොදැන සිටියේ කෙසේද ?

(ඊ) මාධ්‍යවල පුළුල් වශයෙන් වාර්තා කර ඇති පරිදි පරීක්ෂණයක් සහ විමර්ශනයක් කළ (නාගරික සංවර්ධන අධිකාරියේ වර්තමාන සභාපති) මහාචාර්ය නිමල් ද සිල්වාගේ ප්‍රධානත්වයෙන් වූ ස්වාධීන වාස්තු විද්‍යාඥයන් මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව පමණක් එකී හේතු පෙන්වීමේ දැන්වීම් නිත්තු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(එ) (i) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජූනි මස 28 වන දිනැති එකී අමාත්‍ය මණ්ඩල සංදේශයේ වෙනත් දේ අතර මෙසේ සඳහන් නුවූයේද?

"මේ/

"මේ කාරණය සමස්තයක් වශයෙන් ගෙන ඒ පිළිබඳව විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණයක් පවත්වන අතර ඒ මත වාර්තාවක් රජයට සහ මහජනයාට සපයනු ලැබේ. කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ පදනම් කරගෙන උචිත ක්‍රියා මාර්ගයක් ගැනීම රජය විසින් සළකා බලනු ඇත. මේ සමථය ගැන සොලිසිටර් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාව දැනුවත් කොට ඇත."

(ii) ඔබ විසින් පිළිගෙන ඇති පරිදි 1995 ජූනි මස 30 වන දින පුවත්පත් සාකච්ඡාවේදී ඔබ මෙසේ ප්‍රකාශ කලේ නැද්ද ? - "කෙසේ වුවද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සහ අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වරදකරුවන්ට විරුද්ධව නෛතික ආයතන මගින් ගනු ලබන ක්‍රියා වලට මේ සමථයේ කිසිම සම්බන්ධයක් නැත."

(iii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සහ අල්ලස් හා දූෂණ පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වරදකරුවන්ට විරුද්ධව අධිකරණ අමාත්‍යවරයා වශයෙන් නෛතික ආයතනය මගින් ගැනීමට සැලැස් වූ අශෝභන ක්‍රියා මාර්ග මොනවාද ?

(iv) ඔබ විසින් පිළිගෙන ඇති පරිදි සහ 1995 ජූලි මස 25 වන දිනැති "ඩේලි නිව්ස්" පත්‍රයේ වාර්තා කර ඇති පරිදි ඔබ පුවත් වලට මෙසේ ප්‍රකාශ කලේ නැද්ද ? "විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පවත්වන හිල්ටන් කාරණය පිළිබඳව පරීක්ෂණය නිමවන තෙක් සමථයෙන් අදහස් කර ඇති ගෙවීමක් සිදු කිරීම හෝ සමථයේ වෙනත් යම් අංශයක් කවර හෝ ආකාරයකින් ක්‍රියාත්මක කිරීම හෝ කරනු නොලැබේ".

(v) ඔබ විසින් පිළිගෙන ඇති පරිදි 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුවේදී ඔබ විසින් ප්‍රකාශ කළේ නැද්ද ? - "මේ කාරණය පිටුපස ඇති සිද්ධි හෙළි කිරීමට මැතිවරණ ව්‍යාපාරයේදී පොදු ජන එක්සත් පෙරමුණ පොරොන්දු වූ අතර එම පොරොන්දුව ඉටු කිරීම් වස් ගනුදෙනුව පිටුපස ඇති අවස්ථාගත කරුණු පිළිබඳව පරීක්ෂණ කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලදී. මේ කොමිෂන් සභාව විසින් මේ කාරණා පිළිබඳ පරීක්ෂණ දිගටම පවත්වන බවද, මේ රටේ නීති යටතේ වරදකරුවන්ට විරුද්ධව කටයුතු කරන බවට සහතික වීමට අවශ්‍ය සියලු පියවර රජය විසින් ගන්නා බවද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

"කෙසේ වුවද හිල්ටන් ව්‍යාපෘතිය පිටුපස ඇති උද්දේශිත වංචාව සහ අනිසි ක්‍රියා වලට අදාළ අවස්ථාගත කරුණු ගැන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සොයා ගන්නා කරුණු ගැන කටයුතු කිරීම ප්‍රමාද කිරීමට හෝ එම කටයුතු පසෙක තැබීමට කිසිම අවස්ථාවක කිසිම චේතනාවක් හෝ අදහසක් නොතිබූ බව ද, කොමිෂන් සභාව විසින් යම් වැරදි ක්‍රියාවක් සොයා ගනු ලැබුවහොත්, හෝ එවැනි ක්‍රියාවක් බව තීරණය කලහොත් රටේ නීති යටතේ එම ක්‍රියා සම්බන්ධයෙන් නදින් කටයුතු කිරීම රජයේ අදහස වශයෙන් දිගටම පැවති බව ද, නැවතත් ප්‍රකාශ කළ යුතුය".

(vi) නැවත 1995 සැප්තැම්බර් මස 19 වන දින ඔබ පාර්ලිමේන්තුවට පහත සඳහන් අයුරු ප්‍රකාශ කළේ නැතිද ?

"හිල්ටන්/

"හිල්ටන් ව්‍යාපෘතිය පසුපස සිදු වී ඇතැයි කියනු ලබන වංචා සහ අයථා ක්‍රියාවන්ට අදාළ වන්නා වූ තත්ත්වාකාරයන් තුළට විශේෂ ජනාධිපති කොමිෂම විසින් පවත්වා ගෙන යනු ලබන පරීක්ෂණ කෙරෙහි භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සමථය ගිවිසුම් අත්සන් කිරීම, කිසිසේත්ම බලපෑමක්, අඩපණ වීමක් හෝ විපාකයක් සිදු නොවනු ඇත හෝ සිදු නොවිය යුතුය, වරද සිදු කිරීමක් කොමිෂම විසින් අනාවරණය කර ගනු ලැබුවහොත් හෝ සොයාගත හොත්, වරදකරුවන්ට එරෙහිව රටෙහි නීති යටතේ දැඩිලෙස ක්‍රියා කිරීමේ රජයේ අරමුණ එලෙසම පවතින්නේය".

(ඒ) හිල්ටන් හෝටලය පිළිබඳ කාරණය ගැන පරීක්ෂණය කොමිෂන් සභාව විසින් 1996 ඔක්තෝබර් සිට පරීක්ෂණයට ගෙන නැති බව ඔබ පිළිගන්නේ නැද්ද ? එසේ නැත්නම් එය අවසාන වරට පරීක්ෂණයට ගන්නේ කවද්ද ?

(ඔ) ව්‍යවස්ථාපිත නීතිය යටතේ ගත යුතුව තිබුනු පියවර ඔබ සහ එවකට ආයතනයේ සාමාජිකයන්ව සිටි තැනැත්තන් ක්‍රියා මාර්ගයක් නොගන්නේ වෙනත් දේ අතර, ජනාධිපති නීතිඥ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි මහතාගේ සම්බන්ධ වීම සහ හවුල්කාරත්වය නිසා බව ඔබ පිළිගන්නේද?

(ඕ) ජනාධිපති නීතිඥ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි මහතා සමග ඔබ දැඩි පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති බව ඔබ පිළිනොගන්නේද?

<u>පැමිණිල්ලේ 13 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 19 සහ 20 වන ඡේදවල සම්ප්‍රකාශ වලට අදාලව.</u>

8. (අ) පැමිණිලිකරුගේ ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති කරගත් හිල්ටන් සමථය රජයට සහ රටට ඉමහත් ලෙස වාසි සහගත වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ආ) (i) ඔබ විසින් පිළිගෙන ඇති පරිදි සමථය සමස්ථයක් වශයෙන් කියවිය යුතු නම්, පැමිණිලිකරුට අදාළ වූ එක් කොන්දේසියක් රජයට පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් අවධාරණයෙන්ම සඳහන් කර, 1995 අගෝස්තු මස 08 වන දින පාර්ලිමේන්තුව, එමගින් මහජනයා නොමග යැවීමෙන්, එයින් ඊට අදාළ සම්පූර්ණ කරුණුන්, වුවමනාවෙන්ම වසන් කරමින් සහ අනාවරණය නොකරමින් උත්සාහයන් දැරුවේ මන්ද?

(ii) එමගින් ඔබ පැමිණිලිකරු අවමානයට පාත්‍ර කලේ නැද්ද? එසේ නොවේ නම්, එයින් සිදු වූයේ කුමක්ද?

(ඇ) පැමිණිලිකරු විසින් ඔබට හෙළි කරන ලද තොරතුරු පදනම් කරගෙන 1995 ජූනි මස 30 වන දිනැති හෝ ඒ ආසන්නයේදී පුවත්පත් සාකච්ඡාවේදී ඔබ ප්‍රකාශ කල බව ඔබේ උත්තරයේ 23 වන ඡේදයෙන් පිළිගත් පසු, ඔබ විසින් කැඳවන ලද ඒ පුවත්පත් සාකච්ඡාවේ තිබිය යුතු ප්‍රකාශයක්, පිළියෙල කරන ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටියේ ඔබය යන්න ඔබ පිළිගන්නේ නැද්ද?

(ඈ) එකී පුවත්පත් සාකච්ඡාව සඳහා එකී ප්‍රකාශය පිළියෙල කිරීමට සහ එම සාකච්ඡාවට පැමිණ සිටීමට ඔබ පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටියේ හිල්ටන් සමථයට එළඹීම සඳහා සාකච්ඡා පිළිබඳ කටයුතු ඉටුකලේ පැමිණිලිකරු බව ඔබ ඉතා හොඳින් දැන සිටි නිසා යැයි ඔබ පිළිනොගන්නේද?

(ඉ) රජයට සහ රටට එතරම් විශාල වාසියක් ඇති වූයේ සමාජ දේශපාලන පීඩන සහ බාධක මැද පැමිණිලිකරු විසින් දරණ ලද තනි ධෛර්යවන්ත ප්‍රයත්නයන් නිසා නොවේ නම්, එම ප්‍රතිඵල ඇතිවූයේ කාගේ ප්‍රයත්නයන් නිසාද?

(ඊ) /

(ඒ) හොටේල් ඩිවෙලපර්ස් සමාගම/හිල්ටන් හෝටලය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පැමිණිලිකරු/පැමිණිලිකරුගේ නීතිඥයන් විසින් නොයෙකුත් කරුණු නියෝජනය කර තිබියදී ඔබ අදාළ කාලයේදී සෙත් ආයතනයේ සාමාජිකයකු වශයෙන් කවර අන්දමේ හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැර සහ අතපසු කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඓ) වෙනත් දේ අතර, එම දිනය ඔබගේ ජීවිතයේ ප්‍රීතිමත්ම දිනය බව කියමින් සමථය සඳහා ප්‍රසංශාව ඔබ ලබා ගනිමින් සමථය ඔබේ හෝ රජයේ ජයග්‍රහණයක් බව පෙන්වා සිටිමින් ඔබ කීර්තියෙන් නැහැවෙමින් පැමිණිලිකරුට නීත්‍යානුකූලව හිමි ගෞරවය පැමිණිලිකරුගෙන් සොරා ගැනීමට 1995 ජූලි මස 30 වන දින හෝ ඒ ආසන්නයේ පුවත්පත් සාකච්ඡාවේදී ඔබ උත්සාහ කළ බව ඔබ පිළිනොගන්නේද ?

<u>පැමිණිල්ලේ 14 වන ඡේදය සම්බන්ධයෙන් වූ උත්තරයේ 21 වෙනි ඡේදයේ ප්‍රකාශ වලට අදාළව.</u>

9. (අ) 1995 ජූලි මස 30 වන දින පැවති පුවත්පත් සාකකච්ඡාවේදී "ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග අත්සන් කරන ලද සමථය ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම මර්ධනය කිරීමේ පොදු පෙරමුණ රජයේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධාන ප්‍රතිපත්ති වලට සහ විශාල ප්‍රමාණයේ ඉතිරිවීමක් ඇති කරගෙන ඇති රජයේ කැප වීමට අනුකූල වනු යැයි ඔබ ප්‍රකාශ කර ඇති බව ඔබගේ උත්තරයේ 24 වන ඡේදයෙන් ඔබ පිළිගෙන නොතිබුනේද ?

(ආ) එසේ ප්‍රකාශ කිරීමට හිල්ටන් සමථය පිළිබඳ අතීත පසුබිම සහ ඊට අදාළ අවස්ථාගත කරුණු ඔබ දැන සිටියේ නැද්ද ? එසේ නැතිනම් ඔබ එසේ ප්‍රකාශ කළේ කෙසේද ?

(ඇ)/

(ඇ) ඔබ ප්‍රකාශ කර ඇති පරිදි ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වළක්වා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ඔවුන්ට දන්වා තිබූ නොයෙකුත් බරපතල කාරණා ගැන ක්‍රියාමාර්ගයක් ගැනීම එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම විය යුතුව තිබූ බව ඒ අනුව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඈ) ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි දැන සිටි බරපතල සංස්ථාගත කරුණු යටතේ ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසා කෑම වැළැක්වීම සඳහා පැමිණිලිකරු විසින් ෆෝර්ඩ් රෝඩ්ස් තෝර්න්ටන් සමාගමේ විගණකවරුන්ට දන්වා තිබූ ආකාරයට, එම විගණකවරුන් එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් සහතික කිරීමෙන් වැළකී සිටිය යුතු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඉ) 1990 සිට පැමිණිලිකරු විසින් අනාවරණය කළ/හෙළි කල බරපතල අවස්ථාගත කරුණු අනුව ප්‍රධාන කොටස්කරු සහ ඇපකරු වන රජය ඉක්මන් සහ ඵලදායී ක්‍රියාමාර්ගයක් ගත්තේ නම් ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම එසේම වළක්වන්නට තිබුණේ නැද්ද ?

(ඊ) ඔබ විසින් පිළිගත් පරිදි එච්ඩීඑල් සමාගම සෙත් ආයතනයේ ඇති නියෝග වලින් පාලනය වන නිසා එම නීති සහ නියෝග උල්ලංඝනය කෙරෙන බරපතල විෂමාචාර කිහිපයක් පැමිණිලිකරු විසින් සෙත් ආයතනයේ සාමාජිකයකු වශයෙන් ඔබ ද ඇතුළුව, එවකට එකී සාමාජිකයන්ට ජාතික සම්පත්වල එකී කොල්ලකෑම සහ ගසාකෑම වළක්වා ගැනීම සඳහා, ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි, ක්‍රියා මාර්ගයක් ගත යුතුව තිබුණු බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(උ) ඉහත අංක .5 දරණ විචාරණයේ වඩාත් පූර්ණ ලෙස දක්වා ඇති පරිදි සෙත් ආයතනයට සහ එහි සාමාජිකයකු වශයෙන් ඔබට නොයෙකුත් කරුණු නියෝජනය කිරීමේ අවස්ථාගත කරුණු යටතේ ජාතික සම්පත් එසේ කොල්ලකෑමට සහ ගසා කෑමට අදාළ අවස්ථාගත කරුණු සහ සිද්ධි සෙත් ආයතනය හොඳින් දැනසිටි බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඌ) ඔබ විසින් පිළිගෙන ඇති 1985 ජූලි මස 01 වන දින "ද අයිලන්ඩ්" පුවත්පතේ ('AIA' ලේඛනයේ) වාර්තා කර ඇති පරිදි රුපියල් මිලියන 10200 ක කපා හැරීමක් සහිතව, එවැනි ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වැළැක්වීම සඳහා සමර්ථයකට එළඹිය හැකි වූයේ, ඔබ විසින් එසේ ප්‍රකාශ කර ඇති පරිදි, ජාතික සම්පත් එසේ කොල්ලකෑම සහ ගසාකෑම වැළැක්වීම සඳහා අතුරු ඉන්ජන්ෂන් තහනම් ලබාගෙන 1990 සිට අවුරුදු ගණනාවක් තිස්සේ වියදම් දරමින් පැමිණිලිකරු විසින් දැරූ නොපසුබස්නා උත්සාහයන් නිසා පමණක්ය යන්න ඔබ ව්‍යංගයෙන් පිළිගෙන නැද්ද ?

(එ) පැමිණිලිකරු විසින් ලබාගෙන තිබූ අතුරු ඉන්ජන්ෂන් තහනම් පිළිගනිමින් ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රේෂ්ඨාධිකරණය එකී අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුත් කර ඇත්තේ එච්ඩීඑල් සමාගමෙන් සහ රටින් විදේශ විනිමය කුට ලෙස මහා පරිමාණයෙන් ගරා ගැනීම වැළැක්වීමට බවට උගත් දිසා විනිසුරුවරයා විසින් ඉදිරිපත් කරන ලද තර්කය නැවත ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඒ) රජය විසින් පහත දැක්වෙන දේ කළයුතු බවට පහත දැක්වෙන කොන්දේසි හිල්ටන් සමර් ගිවිසුමේ නීතිපතිවරයා විසින් ඇතුළත් කර ඇත්තේ මේ කරුණු නිසාම බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(i) 1992 දෙසැම්බර් මස 02 වෙනි දින සහ ඊටපසුව 1994 සැප්තැම්බර් මස 30 වන දින දක්වා අධ්‍යක්ෂකවරුන් වශයෙන් සිටි අය බැහැර කිරීම සඳහා එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යවහගත කිරීම ;

(ii) 1990 මාර්තු මස 31 වෙනි දිනයෙන් අවසාන වූ වර්ෂය සඳහා එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් නැවත ප්‍රකාශ කිරීම සඳහා එච්ඩීඑල් සමාගමේ වර්තමාන විගණකවරුන් ඉවත් කරවීම ;

(iii)/

(iii) එවැනි ක්‍රියා මාර්ග ගැනීමේ පැමිණිලිකරුගේ අයිතිවාසිකම පැමිණිලිකරු විසින් ද, ඉතිරි කර ගන්නා අතර පැමිණිලිකරු විසින් කරන ලද නියෝජන මත සෙත් ආයතනයේ සාමාජිකයන්ගේ ක්‍රියාකලාපය සහ ක්‍රියා සම්බන්ධයෙන් එම සාමාජිකයන්ට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගැනීම ;

<u>පැමිණිල්ලේ 15 වන සහ 16 වන ඡේද සම්බන්ධයෙන් වූ උත්තරයේ 22 වන, 23 වන සහ 24 වන ඡේදවල ඇති සම්ප්‍රකාශ වලට අදාළව</u>.

10. (අ) 1995 ජූනි මස 30 වන දින මුදල් අමාත්‍යාංශයේදී පැවැත් වූ පුවත්පත් සාකච්ඡාව ඔබ විසින් කැඳවන ලද්දේ හිල්ටන් සමථ ගිවිසුමට එදින එළඹෙන බව ඔබ දැනගත් 1995 ජූනි මස 28 වන දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන් පසුව බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ආ) මේ කාරණයේදී සම්බන්ධ වන විදේශ සහභාගීත්වයේ වැදගත්කම නිසා එකී පුවත්පත් සාකච්ඡාව සංචාරක ඇමතිතුමාගේ සහභාගීත්වය ඇතිව විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් කැඳවිය යුතු බව ජනාධිපති කුමාරණතුංග මැතිණිය යෝජනා කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඇ) එම අවස්ථාගත කරුණු අනුව, වෙනත් දේ අතර හිල්ටන් සමථය ගැන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අඩංගු හිල්ටන් සමථය පිළිබඳ අදාළ ලිපිගොනු එකී අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන් පසුව විදේශ කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත්, ඊටපසුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා පැමිණිලිකරු අමතා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටි බවත්, ඔබ පිළිගන්නේ නැද්ද ?

(ඈ) එකී පුවත්පත් සාකච්ඡාවට පැමිණෙන ලෙස සහ ඒ සඳහා ප්‍රකාශයක් පිළියෙල කරන ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටියේ ඔබ බව ඔහු පිළිගන්නේ නැද්ද ?

(ඉ)/

(ඉ) 1995 අගෝස්තු මස 08 වන දින ඔබ විසින් පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ "නිහාල් අමරසේකර මහතාගේ එකඟත්වය නොමැතිව කෙසේවත් සමථයකට එළඹිය නොහැකි නිසා ඒ මහතා ඇතුළුව සියළු අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා ආරම්භ කිරීමට ගරු ජනාධිපතිතුමිය මේ පසුබිම යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයාට විධාන කළාය." යනුවෙන් ඔබ ප්‍රකාශ කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඊ) හිල්ටන් සමථය සාර්ථක ලෙස මෙහෙයවා එය නිම කළේ පැමිණිලිකරු බව ඔබ හොඳින්ම දැන සිටි නිසා 1995 ජූනි මස 30 වන දින එකී පුවත්පත් සාකච්ඡාවට ඔබ පැමිණිලිකරුට එසේ ආරාධනා කළ බව ඔබ පිළිගන්නේ නැද්ද ?

(උ) පැමිණිලිකරු සමථය පිළිබඳ කටයුතු කළ නිසා සමථයේ විස්තර ඔහු දන්නා බව ප්‍රකාශ කර යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් පැමිණිලිකරුගෙන් විමසන ලෙස ඔබ විසින් එකී පුවත්පත් සාකච්ඡාවේදී මාධ්‍යකරුවන්ට ආරාධනා කළ බව ඔබ පිළිගන්නේ නැද්ද ? එසේ නැත්නම් ඔබ ප්‍රකාශ කළේ කුමක්ද ?

(ඌ) 1995 ජූලි මස 01 වන දින "අයිලන්ඩ්" පුවත්පතේ (AIA ලේඛනයේ) එකී පුවත්පත් සාකච්ඡාව ගැන තිබූ වාර්තාව පිළිගැනීමෙන් පසුව "AIB" යනුවෙන් ලකුණු කළ 1995 ජූලි මස 01 වන දින රජයෙන් පාලනය වන "දිනමිණ" පත්‍රයේ ඒ ගැන පළ වූ ඊට සමාන වාර්තාවක් ඔබ ප්‍රතික්ෂේප කරන්නේ කෙසේද ? ඔබ ප්‍රතික්ෂේප කිරීමට බලාපොරොත්තු වූ නිශ්චිත ප්‍රකාශය කුමක්ද ?

(එ) (i) 1995 ජූනි මස 30 වන දින පැවති පුවත්පත් සාකච්ඡාවේදී "කෙසේ වුවද, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සහ අල්ලස් හා දූෂණය පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් තීරණය කරන ලබන වැරදිකරුවන්ට විරුද්ධව නෛතික ආයතන මගින් ගනු ලබන සංශෝධන ක්‍රියාමාර්ග වලට මේ සමථයේ කිසිම සම්බන්ධයක් නැත" බව ප්‍රකාශ කළ බව පිළිගන්නේ නැද්ද ?

(ii)/

(ii) ඒ අනුව අධිකරණ අමාත්‍යවරයා වශයෙන් නෛතික ආයතන ලවා ඔබම කියා ඇති පරිදි ජාතික සම්පත් කොල්ලකෑමට සහ ගසා කෑමට තැත්කල වැරදිකරුවන්ට විරුද්ධව ඔබ ගෙන ඇති දණ්ඩන ක්‍රියා මාර්ගය කුමක්ද ?

<u>පැමිණිල්ලේ 17 වන ඡේදය සම්බන්ධයෙන් උත්තරයේ 25, 26 වන ඡේදවල ඇති සම්ප්‍රකාශවලට අදාළව:</u>

11. (අ) 'ඒ2ඒ සහ 'ඒ2බී' යනුවෙන් ලකුණු කළ ලිපිවල ප්‍රකාශ කර ඇති පරිදි ඔබ විසින් විධාන කර තිබූ ආකාරයට එම ලිපි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒවායේ නම් සඳහන් තැනැත්තන්ට ලියා ඇති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ආ) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණයේ තීරණය දෙන තෙක් සමථය ක්‍රියාත්මක නොකරන බව එකී 'ඒ2ඒ සහ 'ඒ2බී' ලිපිවල ප්‍රකාශ කර ඇති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඇ) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය තවමත් නිමකර සහ තීරණය කර නැති බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඈ) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය නිමකර තීරණය කිරීමට පෙර 1996 ඔක්තෝබර් මාසයේදී හිල්ටන් සමථය ක්‍රියාත්මක කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඉ) ඔබ විසින් පිළිගෙන ඇති පරිදි 1995 ජූලි මස 25 වන දින ඩේලිනිවුස් පත්‍රයේ වාර්තා කළ ආකාරයට හිල්ටන් සමථය අත්හිටවීම නිවේදනය කිරීමේදී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් කාරණය පිළිබඳ පරීක්ෂණය නිමකරන තෙක් සමථය කෙසේවත් ක්‍රියාවේ නොයෙදවන බවට ඔබ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඊ)/

(ඒ) 1996 ඔක්තෝබර් මාසයේ දී සමථය ක්‍රියාත්මක කර බලාත්මක කරනු ලැබූ විට, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් පරීක්ෂණය නිමකර තීරණය කරන තෙක් හිල්ටන් සමථය ක්‍රියාත්මක නොකිරීමේ ඉහත කී ස්ථාවරය ඉවත් කර ගැනීම පිළිබඳව කිසිම ප්‍රසිද්ධ ප්‍රකාශයක් හෝ පැහැදිලි කිරීමක් ඔබ විසින් නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඓ) ඔබ විසින් 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවේදී පිළිගත් පරිදි නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් හිල්ටන් සමථය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම ඔබ විසින්, මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිනිය සමග මැදිහත් වීමෙන් සිදුකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඓා) නීත්‍යානුකූලව සහ ගිවිසුම්මය වශයෙන් එළඹෙන ලද එකී සමථ ගිවිසුම් අත්හිට වූයේ කවර නෛතික පදනමක් මතද?

(ඔ) ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය සහ ක්‍රියා ඉහත කී පරිදි 1995 ජූනි මස 30 වන දින පැවැත්වූ කලින් පුවත්පත් සාකච්ඡාවේදී ඔබ දැරූ ස්ථාවරය සැළකිය යුතු ලෙස ආපසු හරවාවීමක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඕ) එවැනි සැලකිය යුතු ආපසු හරවාවීමක් කළේ ඔබේ පුද්ගලික යහපත උදෙසා බව ඔබ පිළිගන්නේ නැද්ද?

<u>පැමිණිල්ලේ 18 සහ 19 වන ඡේද සම්බන්ධයෙන් උත්තරයේ 27 වන ඡේදයේ සම්ප්‍රකාශවලට අදාළව:</u>

12. (අ) (i) ඔබ විසින් ප්‍රකාශ කර ඇති පරිදි ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වැළැක්වීම සඳහා කොළඹ දිසා අධිකරණයේ අංක. 3155/විශේෂ දරන නඩුව පවරා ජපන් සමාගම්වලට ගෙවීම් සම්බන්ධයෙන් ඉන්ජන්ෂන් තහනම් ලබාගත්තේ පැමිණිලිකරු බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) ඔබ විසින් ප්‍රකාශ කර ඇති පරිදි, ජාතික සම්පත් කොල්ලකෑම හා ගසාකෑම අනාවරණය වූයේ, එකී නඩුවේදී ගොනු කරන ලද අයැදීම් සහ එහිදී අධිකරණය විසින් කරන ලද නියෝග මලින් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) ජනමාධ්‍ය මගින් පුළුල් ලෙස වාර්තා කර තිබීමෙන් ඉහත කී කරුණු ගැන මහජනයා දැනගත් බවත් ජාතික සම්පත් කොල්ලකෑම හා ගසාකෑම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම ගැන තනිකරම වගකිවයුතු වූයේ පැමිණිලිකරු බවත්, රජය සහ එවකට සෙක් ආයතනයේ සාමාජිකයකු වශයෙන් ඔබ, එසේ ක්‍රියා කිරීමට සිතාමතාම පැහැර හැර සහ අතපසු කර තිබූ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(ආ) (i) 1994 මහා මැතිවරණයේදී සහ ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී පොදු ජනපෙරමුණේ මැතිවරණ ප්‍රචාර කටයුතුවලදී එක් ප්‍රධාන අවියක් වශයෙන් එමැනි ප්‍රසිද්ධ අනාවරණය කිරීම් යොදාගත් බව ඔබ පිළි නොගන්නේද?

(ii) 1995 අගොස්තු මස 8 වන දින ඔබ පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ, වෙනත් දේ අතර, ඔබ මෙසේ ප්‍රකාශ කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

> "මේ කාරණය පිටුපස ඇති සිද්ධි හෙළිකිරීමට මැතිවරණ ව්‍යාපාරයේදී පොදුජන එක්සත් පෙරමුණ විසින් පොරොන්දු වූ අතර එම පොරොන්දුව ඉටුකිරීම් වස් ගනුදෙනුව පිටුපස ඇති අවස්ථාගත කරුණු පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලදී. මේ කොමිෂන් සභාව විසින් මේ කාරණා පිළිබඳව පරීක්ෂණ දිගටම පවත්වන බවද මේ රටේ නීති යටතේ වරදකරුවන්ට විරුද්ධව කටයුතු කරන බව සහතික වීමට අවශ්‍ය සියලු පියවර රජය විසින් ගන්නා බවද නැවතත් ප්‍රකාශ කළ යුතුය."

(ඇ) (i) ඔබ විසින් සියුම් ලෙස විමසූ සහ පරීක්ෂා කරන ලද සමථ ගිවිසුම්වල, අංක. 3 දරන ගිවිසුමේ පූර්විකාවේ, එකී පූර්විකාවේ වඩාත් පූර්ණ ලෙස දක්වා ඇති සමථය ඇති කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටිමින් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා පැමිණිලිකරු සමග මැදිහත් වී ඇතැයි ප්‍රකාශ කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1995 අගොස්තු මස 8 වන දින ඔබ විසින් පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ ඔබ මෙසේ ප්‍රකාශ කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

"නිහාල් ශ්‍රී අමරසේකර මහතාගේ එකඟත්වය නොමැතිව කෙසේවත් සමථය කට එළඹිය නොහැකි නිසා ඒ මහතා ඇතුළුව සියලු අදාළ පාර්ශවකරුවන් සමග කථාබහ ආරම්භ කිරීමට ගරු ජනාධිපතිතුමිය මේ පසුබිම යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයාට විධාන කළාය."

(ඈ) (i) 1995 ජූනි මස 28 වන දින හිල්ටන් සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට පෙර, පැමිණිලිකරු විසින් හිල්ටන් සමථයට අදාළ සියලු වැදගත් ලේඛණ සහ කරුණු සොලිස්ටර් ජනරාල්වරයා මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂි වශයෙන් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළ බව ඔබ පිළිගන්නේ නැද්ද? නොපිළිගන්නේ නම් ඒ ඇයි?

(ii) එකී සමථ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර, එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව සොලිස්ටර් ජනරාල්වරයා ලිඛිත අනුමතිය දී තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1995 ජූනි මස 28 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 1995 ජූනි මස 21 වන දින අමාත්‍ය මණ්ඩල සන්දේශයේ වෙනත් දේ අතර - "සොලිස්ටර් ජෙනරාල්වරයා මේ සමථය ගැන කොමිෂන් සභාව දැනුවත් කර ඇත." යනුවෙන් ප්‍රකාශ කර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද"

(iv)/

(iv) 1995 ජුනි මස 28 වන දින සමර් ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව පැමිණිලිකරු, අත්සන් කර තිබූ සමර් ගිවිසුම් ගැන සොලිස්ටර් ජනරාල්වරයා මාර්ගයෙන්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ ප්‍රසිද්ධියේ සාක්ෂි දී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද? නොපිළිගන්නේ නම් ඒ ඇයි?

(v) පැමිණිලිකරු විසින්, එමගින්, ජනමාධ්‍යවල පුළුල් ප්‍රචාරයක් දී තිබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ විභාගවලට පෙර, හිල්ටන් සමර් ගිවිසුම් නිමකිරීම සහ අවසාන වශයෙන් සකස් කිරීම පිළිබඳ කටයුතු, සම්පූර්ණ අනාවරණය කිරීම් සහිතව සිදුකර ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vi) පාරදෘශ්‍යතාවය පිළිපැදීමට රජයට ඇති ගැඹුරු සහ සුපැහැදිලි කැපවීම ගැන නොසලකා, රජයේ කොන්ත්‍රාත්තු අවසාන වශයෙන් සකස් කිරීමේ හා නිම කිරීමේ රජය අනුගමනය කරන සාමාන්‍ය සිරිත සහ පටිපාටිය එසේ නොවන බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vii) හිල්ටන් සමර් ගිවිසුම තරම් ප්‍රසිද්ධ අනාවරණය කිරීම් සහ පාරදෘශ්‍යතාවයක් නොමැතිව වෙනත් කොන්ත්‍රාත්තු/ගිවිසුම් කීපයකට රජය ඇතුළත් වී ඇති බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඉ) (i) මුදල් අමාත්‍යංශයේ ලිපිගොනු වල ඇති නොයකුත් සංදේශ පත්‍ර සහ සටහන් වලින් සාක්ෂි දරන පරිදි, ඇති කරගත් කථා බහ සහ එළඹෙන ලද සමථය ගැන මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා සහ ගරු මුදල් අමාත්‍යවරයා යන දෙදෙනාම කෙලින්ම සහ අනියම් වශයෙන් සම්පූර්ණයෙන්ම දැන සිටි බවත් ඒවාට සම්බන්ධ වූ බවත් ඒවා අවසාන වශයෙන් තීරනය කළ බවත්, ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) සමථ කථා බහ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මුදල් අමාත්‍යවරයා/රජය වෙනුවෙන් ක්‍රියා කළ නීතිපතිවරයා සහ/හෝ සොලිසිටර් ජෙනරාල්වරයා ඉදිරිපිට පැවැත්වූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එසේ නම්, සමථ සාකච්ඡාවලට මුදල් අමාත්‍යවරයා කෙළින්ම හෝ අනියම් වශයෙන් කවරවූ හෝ ආකාරයකින් සහභාගී නොවූ බව ඔබ ප්‍රකාශ කරන්නේ කෙසේද?

(ඒ) (i) ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය, ක්‍රියා සහ ප්‍රකාශ, ජාතික සම්පත් එසේ කොල්ලකෑම සහ ගසා කෑම වැලැක්වීමට ව්‍යවස්ථාපිතව බැඳී සිටි පරිදි ක්‍රියා කිරීමට සිතාමතාම සහ උවමනාවෙන්ම පැහැර හැර සහ අතපසු කළ සෙක් ආයතනයේ සාමාජිකයන් වශයෙන්, වෙනත් අය අතර, ඔබට විරුද්ධව ක්‍රියා කිරීමට රජයට කැපවීමක් ඇති කළ අංක. 3 දරන සමථ ගිවිසුමේ කොන්දේසිය ඔබ විසින් සොයා ගැනීමේ සෘජු ප්‍රතිඵලයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) ඉහත කී කොන්දේසිය, සමථ ගිවිසුම් වලට ඇතුළත් කළේ හිටපු නීතිපති, ජනාධිපති නීතිඥ තිලක් මාරපන මහතා විසින් බවද, ඒට සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ ඩග්ලස් ප්‍රේමරත්න මහතාගේ සහ අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ ඒ.එස්.එම්. පෙරේරා මහතාගේ එකගත්වය ලැබී තිබුණු බවද ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1996 ඔක්තෝබර් මාසයේදී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේදී 1996 ඔක්තෝබර් මාසයේදී ලියා අත්සන් කරන ලද පරිශිෂ්ඨයක් මගින් සමථ ගිවිසුම් වලින් බැහැර කරන ලද එකම කොන්දේසි නිශ්චිතවම ඔබට අදාළවූ සහ ඔබට බලපෑ ඉහත කී කොන්දේසිය බවද අධිකරණ අමාත්‍යවරයා සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා, වශයෙන් සියල්ලෝම ඔබගේ විෂයපථය/

යටතට/

යටතට වැටෙන වර්තමාන නීතිපති ජනාධිපති නීතිඥ සරත් ද සිල්වා මහතාගේ, එවකට මුදල් අමාත්‍යංශයේ ලේකම් වූ බී.සී.පෙරේරා මහතාගේ සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වූ ආචාර්ය පී.බී. ජයසුන්දරගේ ඉල්ලීම පිට එම කොන්දේසිය ගිවිසුමෙන් බැහැර කිරීම පැමිණිලිකරු අනුමත කළ බවද එසේ කිරීමට යෙදුනේ පැමිණිලිකරු විරුද්ධ නොවූ නිසා බවද ඔබ පිළිගන්නේ නැද්ද?

<u>පැමිණිල්ලේ 20, 21 සහ 22 වන ඡේද සම්බන්ධයෙන් උත්තරයේ 28 වන ඡේදයේ ඇති සම්ප්‍රකාශවලට අදාළව</u>

13. (අ) (i) හිල්ටන් සමටය පිළිබඳ කාරණය ගැන 1995 අගොස්තු මස 7 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතා පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇසූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) ඊට පසු දිනම, එනම් 1995 අගෝස්තු මස 8 වන දින ඔබේ ප්‍රකාශයට "නියෝජ්‍ය කථානායක තුමෙනි, මේ කාරණයේ වැදගත් කම නිසා ප්‍රශ්නයට තරමක් විස්තර සහිතව උත්තරදීමට මම එබේ අවසරය පතමි." යනුවෙන් පූර්විකාවක් යොදා ඔබ පාර්ලිමේන්තුවේ දීර්ඝ ප්‍රකාශයක් කළ බවත් මේ කාර්යය සඳහා 1995 ජූනි මස 28 වන දින එළඹෙන ලද සමථ ගිවිසුම් සහ මුදල් අමාත්‍යංශයේ ලිපි ගොනු වල ඊට අදාළ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට ඔබට සිදුවන්නට ඇති බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1995 අගොස්තු මස 8 වන දින ඔබ පාර්ලිමේන්තුවට කළ ඉහත කී ප්‍රකාශයේ තවදුරටත් "කෙසේ වුවද, ඊට පසුව, මේ සමථ ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද ගිවිසුම් වලින්

පිළිගත/

පිළිගත නොහැකි ස්වභාවයක වූ බැඳීම් ගණනාවකට රජය යටත් කර ඇති බව නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා විසින් සොයාගෙන මුදල් අමාත්‍යවරයාට දන්වන ලදී" යනුවෙන් ඔබ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළ බව පිළිගන්නේ නැද්ද?

(iv) එම ප්‍රකාශය සකස් කිරීමේදී, සමථ කාරණා මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා සහ මුදල් අමාත්‍යවරයා හොඳින් දැන සිටි බව පැහැදිලිව අනාවරණය කෙරෙමින්,වෙනත් දේ අතර කථා බහ වලට අදාළ සංදේශ සහ සටහන් පිළිබඳව සාක්ෂි අඩංගු වූ මුදල් අමාත්‍යංශ ලිපිගොනු වල අදාළ ලේඛන ඔබ පරීක්ෂා කලේ නැද්ද?

(ආ) (i) 1995 අගෝස්තු මස 8 වන දින පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේ, වෙනත් දේ අතර, එළඹෙන ලද හිල්ටන් සමථ ගිවිසුම් වලින් රජයට පිළිගත නොහැකි බැඳීම් ගණනාවකට රජය යටත් කරනු ලැබූ බව ප්‍රකාශ කර තිබූ බවත් නිශ්චිතව පැමිණිලිකරුට පමණක් අදාළ වූ එක් නිශ්චිත බැඳීමක් ගැන, සමථ ගිවිසුම් වල පැහැදිලිව දක්වා තිබූ පරිදි යටත්වීමට රජයේ බැඳීම අව්‍යශ වූ අවස්ථාගත කරුණු හෙළි නොකර, සඳහන් කළ බවත් නොමග යැවීම සඳහා එම කාරණය වසන් කිරීමට ඔබ උවමනාවෙන්ම තෝරා ගත් බවත් ඔබ පිළිගන්නේ නැද්ද? එය කළේ ඇයි?

(ii) රජයට පිළිගත නොහැකි බැඳීම් ගණනාවක් තිබූ බව ප්‍රකාශ කළ ඔබ, රජයට පිළිගත නොහැකි වූ අනෙකුත් කොන්දේසි/බැඳීම් හඳුන්වාදීම වුවමනාවෙන්ම පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද? එය එසේ නම් මන් නිසාද? එය එසේ නොවේ නම් රජයට පිළිගත නොහැකිවූ අනෙකුත් බැඳීම් මොනවාද?

(iii) බැඳීම් ගණනාවක් පිළිගත නොහැකි බවට වූ තීරණය අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද්දේද? එසේ නම් කවදාද?

(ඇ) /

(ඇ) (i) ඔබද ඇතුලත්ව සෙසු ආයතනයේ එවකට සිටි සමාජිකයන්ට විරුද්ධව රජය විසින් ක්‍රියා කළ යුතු බවට සමථ ගිවිසුමේ ඇති කොන්දේසිය අනුව සලකා බැලීමේදී, ඔබ ඇත්ත වශයෙන්ම සම්බන්ධතාවක් ඇති සහ බලපෑමට ලක්වූ පාර්ශවකරුවකු බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) ඔබගේ පෞද්ගලික සම්බන්ධතාවය සහ ඔබට ඇතිවූ බලපෑම ඔබ උවමනාවෙන්ම වසන් කළ බවත් පාර්ලිමේන්තුවට සහ එමගින් මහජනතාවට ඔබ එය හෙළිදරව් නොකළ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(ඈ) (i) ඔබ විසින් පැමිණිලිකරුට අදාළ එක්තරා ඡේදයක මැද කොටස පමණක්, එහි පද සම්බන්ධතාවය නොමැතිවද, එහි ප්‍රථම සහ පසු කොටස් අත්හැර දමා එය පිළිගත නොහැකි කොන්දේසියක් වශයෙන් හඳුන්වමින් ද ගෙනහැර දැක්වීමෙන් ඔබේ ඉහත කී ප්‍රකාශය සිතා මතාම වුවමනාවෙන්ම සහ දැන දැනම කළ අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශයක් බව ඔබ පිළිගන්නේ නැද්ද? එසේ නැත්නම් එය එසේ නොවන්නේ මන්ද?

(ii) මෙය හිල්ටන් සමථයට අගතියක් සිදු කිරීමේ සහ එය අසාර්ථක කිරීමේ සිතා මතාම ඇති කරගත් චේතනාවෙන් උවමනාවෙන්ම, ඔබේ පෞද්ගලික සම්බන්ධතාවය සහ ඔබට ඇතිවූ බලපෑම නිසා, හිතා මතාම කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) ඔබ විසින් එසේ කළ ඉහත කී නොමග යවන සුළු ප්‍රකාශය නිවැරදි කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ඔබට නිශ්චිතවම ඒ ගැන දන්වා ලිපි ලියුවත්, ඊට පසුව කවර හෝ කිසිම අවස්ථාවක එහි නිවැරදි කිරීමක් ඔබ නොකළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඉ) (i) එවකට අගමැතිණියව සිටි, කුමාරතුංග ජනාධිපතිනියගේ ඉල්ලීමක් මත, මුදල් අමාත්‍යංශයේ ලේකම් විසින්, 1994 සැප්තැම්බර් මසදී, මුදල් අමාත්‍යංශයේ උපදේශකයකු වන ලෙසට, නිහාල් අමරසේකර මහතාට ඇරියුම් කළ බව ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ii) මුදල් අමාත්‍යංශයේ උපදේශකවරයෙකු වශයෙන්වූ ඔහුගේ පත්වීම අළුත් කිරීමට, ඔහුගේ කැමැත්තක් නොමැති බව, මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයාට පැමිණිලිකරු දැනුම්දුන් බව, ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(iii) ඔහුගේ පත්වීම අළුත් නොකිරීමට ද පැමිණිලිකරුගේ කැමැත්ත, මුදල් අමාත්‍යවරයා වශයෙන්, කුමාරතුංග ජනාධිපතිනිය සටහන් කරගත් බව ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(iv) "ඔබගේ නිල කාලය තුල ඔබ විසින් අමාත්‍යංශයට ලබා දුන් අගනා සේවාවන් සඳහා ඔබට කෘතඥතාවය දැක්වීමට මම කැමැත්තෙමි" යනුවෙන් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා වෙනත් දේ අතර, පැමිණිලිකරුට ලියා දැන්වූ බව ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඊ) (i) ඊට පසු පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතා විසින් සති දෙකකට හෝ තුනකට කලින් මතු කරනලද වෙනත් ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්, පැමිණිලිකරු සම්බන්ධයෙන් 1995 සැප්තැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවේ වැඩිපුර ප්‍රකාශයක් ඔබ කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) 1995 සැප්තැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවට කළ එකී ප්‍රකාශයේ, වෙනත් දේ අතර, "මුදල් අමාත්‍යංශයේ උපදේශකයකු වශයෙන් වූ නිහාල් අමරසේකර මහතාගේ

කොන්ත්‍රාත්තුව/

කොන්ත්‍රාත්තුව 1995 සැප්තැම්බර් 21 වන දින අහෝසිවේ. භාණ්ඩාගාරයේ ලේකම්වරයා පිළිබඳව අවශ්‍ය වන උචිත පියවර අතිගරු ජනාධිපතිනිය විසින් සලකා බලාගෙන යනු ලැබේ." යනුවෙන් ඔබ ප්‍රකාශ කළ බව ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(iii) එමගින් ඔබ, මහජනයා ඉදිරියේ පැමිණිලිකරුට අවමන් නොකළේද? නොකළේ නම් ඒ කෙසේද?

(iv) අනතුරුව, එකී භාණ්ඩාගාරයේ ලේකම් ඒ.එස්.සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් උසස් කරනු ලැබූ බව, ඔබ පිළි නොගන්නේද? එසේ නම් ඒ කෙසේද?

(v) සියලුම කරුණු සම්පූර්ණයෙන් සතුව සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා,මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති කුමාරතුංග මැතිණිය විසින් දෙන ලද විධානය මත, පාර්ලිමේන්තුවේ ඉහතකී ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් දීම සඳහා සත්‍ය සහ නිවැරදි කරුණු දක්වමින් 1995 සැප්තැම්බර් මස 18 වන දිනැති නීල උත්තරයක් (A 7 ලේඛනය) පිළියෙල කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(vi) පාර්ලිමේන්තුවේ මතු කරන ලද ප්‍රශ්න වලට උත්තර පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශය විසින් අනුගමනය කරන සාමාන්‍ය පරිපාලනමය ක්‍රමය සහ කාර්ය පටිපාටිය එය බව ඔබ පිළිගන්නේ නැද්ද? එසේ නැත්නම් සාමාන්‍ය ක්‍රමය සහ කාර්ය පටිපාටිය කුමක්ද?

(vii) 1995 සැප්තැම්බර් 18 වන දින දරන එම සත්‍ය සහ නිවැරදි නීල උත්තරය ඔබ විසින් උවමනාවෙන්ම ප්‍රතික්ෂේප කර, දන්නා කරුණු වලට පටහැනිව,1995 සැප්තැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවට ඔබගේම උත්තරය ප්‍රකාශ කල බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඔ) ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වැලැක්වීමෙන් රජයට සහ රටට විශාල සිද්ධියක් ඇතිවීමට හේතුවූ පැමිණිලිකරුගේ ක්‍රියා කලාපය සහ ක්‍රියා අනුව බලන කල එළඹෙන ලද හිල්ටන් සමථ ගිවිසුම්වලට පෞද්ගලික සම්බන්ධතාවයක් තිබූ සහ එවායේ බලපෑමට ලක්වූ පාර්ශවකරුවකු බව ඔබ පාර්ලිමේන්තු වරප්‍රසාදයේ ආවරණය යටතේ 1995 අගෝස්තු මස 8 වන දින සහ 1995 සැප්තැම්බර් මස 19 වන දින වල ඉහත කී අසත්‍ය සහ නොමග යවන සුළු ප්‍රකාශ කිරීම ඉතාමත්ම වැරදි සහගත වූද, ඔබ විසින් නොකළ යුතු වූ ද දෙයක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඕ) (i) බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ගෞරවනීය සම්ප්‍රදාය අනුව පැවත එන පාර්ලිමේන්තු වරප්‍රසාදය නිසා පෞද්ගලික ලාභය අර්ථ සිද්ධිය සහ/හෝ සම්බන්ධතාවය සහ/හෝ පෞද්ගලික සම්බන්ධතාවය සහ වෛරය නිසා ඇති වූද මහජනතාවට නින්දා කිරීමට, අවමන් කිරීමට සහ/හෝ හානි සිදු කිරීමට සිතාමතාම අසත්‍ය සහ/හෝ නොමග යවන සුළුවූද ප්‍රකාශයක් කිරීම සඳහා පාර්ලිමේන්තු වරප්‍රසාද අයුතු ලෙස සහ/හෝ අනිසි ලෙස යොදා ගැනීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමිකමක් නොලැබෙන බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) නීතිය උගත් සහ ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් ලත් නීතිය පිළිබඳ මහාචාර්යවරයකු වන ඔබ පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සංකල්පයට අදාළ ව්‍යවහාරයන් සහ සම්ප්‍රදායන් දැනගෙන සිටිය යුතු බව ඔබ පිළිගන්නේ නැද්ද

(ඒ) (i) 1995 දෙසැම්බර් මස 15 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී දොස්තර රාජිත සේනාරත්න විසින් පාර්ලිමේන්තුවට කරන ලද ප්‍රකාශය පිළිගත් ඔබට, දොස්තර රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේ අනාවරණය කළ කාරණාවලට පටහැනි කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට නොහැකි වූ බව පිළිගන්නේ නැද්ද?

(ii)/

(ii) ආචාර්ය රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේ අනාවරණය කළ නොයෙකුත් කරුණු වලට පටහැනිව කරුණු ඉදිරිපත් කිරීමට සහ/හෝ ඒවා අසත්‍ය යැයි ඔප්පු කිරීමට ඔබට නොහැකි වීමෙන් දොස්තර රාජිත සේනාරත්න විසින් ඔහුගේ එකී ප්‍රකාශයේදී අනාවරණය කළ දේ කරුණු වශයෙන් සත්‍ය සහ නිවැරදි බවද ඔප්පු වූයේ යැයි ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) එකී ප්‍රකාශය ඉදිරියේ 1995 අගෝස්තු මස 8 වන දින සහ 1995 සැප්තැම්බර් මස 9 වන දින පාර්ලිමේන්තුවට කරන ලද ඉහත කී අසත්‍ය සහ නොමග යවන සුළු ඔබේ ප්‍රකාශ වල කවර හෝ නිවැරදි කිරීමක් කිරීම ඔබ සිතා මතාම පැහැර හැර අතපසු කළ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iv) දොස්තර රාජිත සේනාරත්න මහතාගේ එකී ප්‍රකාශයේ ඔහු විසින් සඳහන් කළ එක් කරුණක් වූයේ අර්බුදයක් ඇති කිරීමේ සහ ප්‍රධාන වශයෙන් රජයේ සම්බන්ධතා ආරක්ෂා කිරීමට කොළඹ දිසා අධිකරණයේ අංක. 4414/විශේෂ දරණ නඩුවේදී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් මුදල් අමාත්‍යංශයේ එවකට සිටි ලේකම් ඒ.එස්.ජයවර්ධන මහතා

විසින් දිවුරුම් ප්‍රකාශයක් ගොනුකිරීම නිසා, 1995 නොවැම්බර් මාසයේදී ඔහුට ඉල්ලා අස්වීමට බල කිරීම ඔබේ ක්‍රියා කලාපය සහ ක්‍රියා බව ඔබ පිළිගන්නේ නැද්ද?

(v) මුදල් අමාත්‍යවරයා එකී දිවුරුම් ප්‍රකාශය පරීක්ෂා කර බලා ඒ.එස්.ජයවර්ධන මහතාට වරද නොපැටවූ බවත් ඊට පටහැනිව ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වශයෙන් ඉහල තනතුරකට පත් කළ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(vi) අධිකරණ සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා වශයෙන් ඔබගේ ඉහත කී ක්‍රියා කලාපය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 වන ව්‍යවස්ථාව අනුව අනිසි බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ඒ) (i) ඒ කාලයේදීම හෝ ඒ ආසන්නයේදී 1995 අගෝස්තු මස 24 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා නිශ්චිතවම හිල්ටන් කාරණයට අදාළව ඇතැම් ප්‍රශ්න ඔබෙන් ඇසූ බවත්, වෙනත් දේ අතර, එක් ප්‍රශ්නයක් රජයෙන් ලබාගත් පහසුකම් සඳහා හොංකොංහි බැංකු ගිණුමකට ජපන් යෙන් මිලියන 340 ක (ආසන්න වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 170 ක) උද්දේශිත ගෙවීමක් සම්බන්ධයෙන් වූ බවත් එය ඉතා විශාල අල්ලසක් වශයෙන් සිතිය හැකි යැයි ව්‍යංගවූ බවත් ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රශ්න වලට ඔබ පිළිතුරු නොදුන් බව ඔබ පිළිගන්නේ නැද්ද? මක්නිසාද?

(iii) එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා 1995 නොවැම්බර් මස 20 වන දිනැති ලිපියක්, වෙනත් දේ අතර, "තත්ත්වය පැහැදිලිව පෙන්වා දෙමින්, මගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන ලෙස මම ඉල්ලා සිටිමි. මෙය නොකළහොත් රජය පිළිතුරු නොදී ප්‍රශ්නය මග හරින බව කරුණු දන්නා තැනැත්තන් සැක කරනු ඇතැයි මම සිතමි" යනුවෙන් ප්‍රකාශ කරමින් ඔබට ලියූවේ නැද්ද?

(iv) ඔබ විසින් පිළිගත් පරිදි 1995 ජූනි මස 30 වන දින පුවත්පත් සාකාච්ඡාවේදී අල්ලස සහ දූෂණය පිළිබඳ ස්ථිර කොමිෂන් සභාව විසින් නෛතික ආයතන සමග දණ්ඩනීය ක්‍රියා මාර්ගයක් ගන්න බව ප්‍රකාශ කළ ඔබ මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය කුමක්ද? එසේ නොගත්තේ නම් ඒ මක්නිසාද?

(ඔ)/

(ඕ) (i) 1996 නොවැම්බර් මස 18 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක මහතා 1996 ඔක්තෝබර් මාසයේදී හිල්ටන් සමටය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ගැන ඔබෙන් ප්‍රශ්න ඇසූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) හැන්සාඩ් වාර්තාවේ තීරු 3 කට වැඩි ඉඩ ප්‍රමාණයක් ගත්, ඔබ විසින් පාර්ලිමේන්තුවට වාචිකව උත්තරය කියවූ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතාගේ ඉහතකී ප්‍රශ්න සම්බන්ධයෙන් මෙන් නොව මේ අවස්ථාවේදී ඔබ "එය දීර්ඝ පිළිතුරකි. එය සභාගත කිරීම පිළිගන්නේ නම් මම එය සභාගත කරන්නම්" යනුවෙන් ප්‍රකාශ කරමින් හැන්සාඩ් වාර්තාවේ එක තීරයකට අඩු ඉඩක් ගත් උත්තරයක් සභාගත කළා පමණක් යැයි ඔබ පිළිගන්නේ නැද්ද? ඒ මන්ද?

<u>පැමිණිල්ලේ 23 වන ඡේදය සම්බන්ධයෙන් උත්තරයේ 29 සහ 30 වන ඡේද වල ප්‍රකාශ වලට අදාළව</u>

14. (අ) (i) එච්.ඩී.එල් සමාගමේ විගණක වරුන් වන ෆෝඩ් රෝඩ්ස් තෝර්න්ටන් සහ සමාගමේ හවුල්කරුවන් ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වැලැක්වීමට ක්‍රියා කිරීම පැහැර හැර සහ අතපසු කර තිබෙද්දී, 1995 දෙසැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුවට ඔබ කළ ප්‍රකාශයේදී ඔබ ඔවුන් ආරක්ෂා කළ බව ඔබ පිළිගන්නේ නැද්ද? එසේ නොවේනම් ඔබ කිරීමට අපේක්ෂා කළේ කුමක්ද?

(ii) එකී විගණකවරුන්ගේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු වන රාජන් ආශීර්වාදම් මහතා ඔබ පෞද්ගලික සහ කිට්ටුවෙන් ආශ්‍රය කරන තැනැත්තෙක් බව ඔබ පිළිගන්නේ නැද්ද?

(iii) 1995 දෙසැම්බර් මස 19වන දින ඔබ පාර්ලිමේන්තුවට කළ ප්‍රකාශයේදී එකී රාජන් ආශීර්වාදම් මහතා සහ එකී විගණකවරුන්ගේ ප්‍රමුඛ හවුල්කරු වන්නාවූද ඔබ සමග සෙක් ආයතනයේ සාමාජිකයෙකු සිටියා වූ ද ජී.සී.බී. විජයසිංහ මහතා වරදින් නිදහස් කිරීමට ඔබ අපේක්‍ෂා කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඔබ කිරීමට අපේක්‍ෂා කළේ කුමක්ද?

(iv) ඉහත කී ප්‍රකාශය කිරීමේදී එකී විගණකවරුන් විසින් එච්.ඩී.එල් සමාගමේ එකී වාර්ෂික ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ අවස්ථාගත කරුණු ගැන ඔබ සම්පූර්ණයෙන් දැන සිටි බව පෙන්වූයේ යැයි යන්න ඔබ පිළිගන්නේ නැද්ද?

(v) එසේ නොවේ නම් ඒ සඳහා වගකිවයුතු සහ කරුණු කිවයුතු ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් දෙදෙනකු වරදින් නිදහස් කිරීමේ අදහසින් එකී විගණකවරුන් ආරක්‍ෂා කිරීම සඳහා එම ප්‍රකාශය ඔබ කළේ කෙසේද?

(ආ) (i) 1995 දෙසැම්බර් මස 19වන දින පාර්ලිමේන්තුවට කළ ඔබගේ ඉහතකී ප්‍රකාශයේදී එකී විගණකවරුන්ගේ කලින් සිටි හවුල්කරුවකු සහ එක්සත් ජාතික පක්‍ෂයේ කලින් සිටි සභාපතිවරයකු වූ එන්.ජී.පී. පණ්ඩිතරත්න මහතා එච්ඩීඑල් සමාගමේ එකී වාර්ෂික ගිණුම් විගණනය කළ බව ප්‍රකාශ කර ඒ මහතා පටලැවීමට උත්සාහ කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ii) පූරස්ථ සහ හෘද ශල්‍ය කර්ම යන දෙකම සඳහා එකී එන්.ජී.පී. පණ්ඩිතරත්න මහතා, 1990 මාර්තු මස 31 වන දින එච්ඩීඑල් සමාගමේ එකී වාර්ෂික, විගණය එකී විගණකවරුන් විසින් සිදුකර අවසාන කළ අදාල කාලයේදී රෝහල් ගතව සිටි බව ඔබ දැන සිටියේ නැද්ද?

(ඇ) (i) එච්ඩ්එල් සමාගමේ 1990 මාර්තු මස 31 වන දිනට වාර්ෂික ගිණුම් අධිකරණය විසින් වාරණය කර තිබූ කොළඹ දිසා අධිකරණයේ අංක.3231/විශේෂ නඩුවටද, හිල්ටන් සමථය අදාළ වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ii) එකී නඩුවේ විත්තිකරුවන් ලෙස ඔවුන් එකතු කළයුතු නොවන්නේ මන්ද යන්නට හේතු පෙන්වන ලෙස එකී රාජන් ආශීර්වාදම් මහතාට, ඒ.සී.බී. විජයසිංහ මහතාට සහ එකී විගණකවරුන්ගේ අනෙකුත් හවුල් කරුවන්ට 1994 දී අධිකරණය විසින් දැන්වීම් නිකුත් කර තිබූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(iii) "මා විසින් (එච්ඩ්එල්) සමාගමේ ගිණුම් නිසි පරිදි විගණනය කර අවශ්‍ය පිටපත් කිරීම් නිකුත් කර ඇති බවට", වෙනත් දේ අතර, දිවුරමින් දිවුරුම් ප්‍රකාශයක් එකී විගණකවරුන් සඳහා සහ වෙනුවෙන් 1994 මාර්තු මස 24 වන දින රාජන් ආශීර්වාදම් මහතා විසින් ඉහත කී 3231/විශේෂ නඩුවේදී ඉදිරිපත් කර තිබූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද? එසේ නම් ඒ කෙසේද?

(ඈ) (i) ජාතික සම්පත් කොල්ලකෑම සහ ගසාකෑම වැලැක්වූ වාරණ නියෝග එවකට නිකුත් කර තිබූ 1990 සැප්තැම්බර් මාසයේදී කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරණ නඩුව පැවරීමෙන් සහ එකී විගණකවරුන්ට එහි දැන්වීම් ලැබීමෙන් පසුව, 1990 නොවැම්බර් මාසයේ එච්ඩ්එල් සමාගමේ එකී වාර්ෂික ගිණුම් සහතික කර තිබූ බව ඔබ පිළිගන්නේ නැද්ද?

(ii) එකී ගිණුම් සම්බන්ධයෙන් වූ පැමිණිකරුගේ විරෝධතා ගණන් නොගෙන සහ එය ප්‍රතික්ෂේප කරමින්, එකී විගණකවරුන් විසින් එකී වාර්ෂික ගිණුම් සහතික කරන ලද බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

(iii) එම ගිණුම් සම්බන්ධයෙන් පැමිණිලිකරුගේ ඉල්ලීම පිට, එච්ඩීඑල් සමාගම විසින් නිශ්චිත වශයෙන්ම නියම කරන ලද ඇතැම් පරීක්ෂා කිරීම් නොකර, එකී විගණකවරුන් විසින් එකී වාර්ෂික ගිණුම් සහතික කරන ලද බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

(ඉ) ඉහත අංක .5 දරණ විචාරණවල දක්වා ඇති පරිදි, සෙත් ආයතනය වෙත සහ එහි සාමාජිකයකු වශයෙන් ඔබ වෙතද ඉදිරිපත් කරන ලද නියෝජනයන් හේතුකොට ගෙන, සෙත් ආයතනයේ එවකට සිටි සාමාජිකයකු වශයෙන් ඔබ එකී කරුණු ගැන මුළුමනින්ම දැනගෙන සිටි බව ඔබ පිළිනොගන්නෙහිද ?

(ඒ) (i) විශේෂ ජනාධිපති කොමිසම විසින්, මූලික පරීක්ෂණ වලින් පසු, 1995 දෙසැම්බර් මස 08 වන දින චෝදනා ගණනාවක් ඇතුළත් නිදහසට කරුණු දක්වන ලෙස නියම කෙරෙන නොතීසි එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයන් 3 දෙනෙකු වෙත නිකුත් කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එම නිදහසට කරුණු දැක්වීමේ නොතීසි ජනමාධ්‍ය මගින් විශාල ලෙස ප්‍රචාරය කරනු නොලැබුවේද ? එසේ නම්, ඒ කෙසේද ?

(ii) එකී චෝදනාවල, වෙනත් දේ අතර, පහත දැක්වෙන චෝදනාව ද, ඇතුළත්ව තිබුණු බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

"අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීමට සලස්වන ලද විෂමතා, අඩුපාඩු සහ අක්‍රමිකතා නොසලකා හැර ඇති අතර, එකී සමාගමේ (එච්ඩීඑල් සමාගමේ) 1990 මාර්තු මස 31 වන දින අවසන් වූ වර්ෂයට වාර්ෂික ගිණුම් නීත්‍යානුකූල ගිණුම් ලෙස අනුමත කිරීම පිණිස සාවද්‍ය උත්සාහයක් දරා ඇත. ඒ අනුව, ඉහත කී ප්‍රෝඩාකාරී ක්‍රියා සහ අත්හැරීම් යටපත් කිරීමේ අරමුණින් ගිණුම් පිළිගැනීම පිණිස ක්‍රියා කිරීමට වෑයමක් කර ඇත".

එසේ/

එසේ නම්, ඒ කෙසේද ?

(ල) එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයන් එලෙස වගකිව යුතු බවට සහ ගිණුම් දිය යුතු බවට යටත් කරනු ලැබුවේ නම්, එවැනි අවස්ථාවලදී, එච්ඩීඑල් සමාගමේ විගණකවරුන් ඊට වඩා වැඩි ප්‍රමාණයකින්, සිවිල් සහ සාපරාධී බැඳීමක් දරමින්, ඒ සඳහා ගණන් දීමට සහ වගකීම දැරීමට යටත්ව සිටින බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒ කෙසේද ?

(ළ) 1996 ඔක්තෝබරයේ දී සමථය ක්‍රියාත්මක කිරීමෙන් පසු, කොළඹ දිසා අධිකරණ අංක.3231/විශේෂ දරණ නඩුවේදී, වාණිජ මහාධිකරණය විසින්, එකී විගණකවරුන් ඉවත් කරන ලෙස සහ එච්ඩීඑල් සමාගමේ 1990 මාර්තු මස 31 වන දිනට වූ එකී ගිණුම් නැවත සකස් කර සමාප්ත කරවා ගැනීමට පිණිස අළුත් විගණකවරුන් පත්කර ගන්නා ලෙස ආඥාකොට තීන්දු ප්‍රකාශ කළ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම් ඒ කෙසේද ?

<u>පැමිණිල්ලේ 24 වන ඡේදය සම්බන්ධයෙන් උත්තරයේ 31 වන හා 32 වන ඡේදවල සම්ප්‍රකාශ වලට අදාළව</u> :

15. (අ) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමථ ගිවිසුම් වලට, නීතිපතිවරයා විසින් සකස් කර අවසන් කරන ලද පරිශිෂ්ටයන් ජපන් සමාගම් (මිට්සුයි/තායිසේ) විසින් සහ අතර ලියා අත්සන් කරන ලද බවත්, එය 1996 සැප්තැම්බර් මස 18 වන දින දී ජපානයේ ටෝකියෝ නුවර දී අත්සන් කිරීමට යෙදුණු බවත්, එය 1996 ඔක්තෝබර් මස 26 වන දින කොළඹ දී මුදල් අමාත්‍යාංශයේ ලේකම්/භාණ්ඩාගාරයේ ලේකම් සහ පැමිණිලිකරු විසින් අත්සන් කිරීමට යෙදුණු බවත්, ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

(ආ)/

(ආ) (i) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමථ ගිවිසුම්, අන්‍යෝන්‍ය වශයෙන් අදාළ වූද, අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූද, අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට රැඳී සිටින්නා වූද, 1 සිට 4 දක්වා වූ ගිවිසුම් සංඛ්‍යාවකින් සැදුණු, එක් සංධාන සමථයක අත්‍යාවශ්‍ය කොටස් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද? එසේ නම්, ඒ කෙසේද ?

(ii) 3 වන හා 4 වන ගිවිසුම්වල, වෙනත් දේ අතර, ප්‍රධාන වශයෙන්ම ඇතුළත් වන්නේ, ඉහත කී කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ සහ 3231/විශේෂ දරණ නඩු පැමිණිලිකරු විසින් ඉල්ලා අස්කර ගැනීමට පෙරාතුව ක්‍රියාත්මක කරන ලද පූර්වග කොන්දේසි බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒවායේ ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ මොනවාද ?

(ඇ) (i) 1996 සැප්තැම්බරයේදී/ඔක්තෝබරයේදී ලියා අත්සන් කරන ලද එකී සමථ ගිවිසුම් වලට වූ ඉහත කී පරිශිෂ්ටය යටතේ, ජපන් සමාගම් (මිට්සූයි/තායිසේ) විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට/භාණ්ඩාගාරයේ ලේකම්ට, අවලංගු කළ නොහැකි, ස්ථිර සහ නිශ්චිත ඇටෝර්නි බලපත්‍රයක් දී තිබෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

(ii) එකී ඇටෝර්නි බලපත්‍ර මගින්, අංක.3 හා 4 දරණ ගිවිසුම්වල අන්තර්ගත එකී පූර්වග කොන්දේසි ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාර්යය සඳහා ජපන් සමාගම් (මිට්සූයි/තායිසේ) විසින් දරනු ලබන එච්ඩීඑල් සමාගමේ කොටස් ධාරිතාවෙන් 15% ක ප්‍රමාණයක් මත ඡන්දය දීමට භාණ්ඩාගාරයේ ලේකම්ට සහ/හෝ ඔහුගේ නියෝජිතයාට අධිකාරය හා බලය දී ඇති බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒ ඇටෝර්නි බලය දී ඇත්තේ කවර කාර්යයන් සඳහා ද?

(iii) එමගින්, එච්ඩීඑල් සමාගමේ කොටස් ධාරිතාවෙන් 80% ක ඡන්දය දීමේ අයිතිවාසිකම, එකී පරිශිෂ්ටය මගින් විශේෂයෙන් බැහැර කරන ලද එක් කොන්දේසියක් හැරෙන්නට එකී අංක. 1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම්වල අන්තර්ගත සියලු කොන්දේසි ඉටු කිරීම සහතික කිරීම පිණිස, රජය නියෝජනය කරන, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීම පිණිස. පැමිණිලිකරු විසින් සාකච්ඡා කරන ලද බව සහ ඒ අයිතිය එලෙස ලබාගත් බව ඔබ පිළිනොගන්නෙහිද ?

(iv) එකී පරිශිෂ්ටයේ ඇති පහත දැක්වෙන අංක. 2 දරණ වගන්තිය මගින්, සමථ ගිවිසුම් අංක. 4 හී, ඇතුළත් කොන්දේසිවල නියමයන් අනුව, එච්ඩීඑල් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය යටතේ, වෙනත් දේ අතර, ජපන් සමාගම් වලට (මිට්සුයි/තායිසේ) ඇති අයිතිය ඔවුන් විසින් පාවිච්චි නොකිරීමට එකී ජපන් සමාගම් එකඟ වී පොරොන්දු වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

> "2. එකී අංක. 4 දරණ ගිවිසුමේ එකී 3(ii)(ආ) දරණ උප වගන්තියේ නියම කරනු ලැබ ඇති ඉහත කී කොන්දේසිය ඉටු කරන තෙක්, එකී අංක. 4 දරණ ගිවිසුමේ 3(ii)(ආ) උප වගන්තියේ සඳහන් වන, ඒ ගිවිසුමට අමුණා ඇති 'එක්ස්' දරණ ඇමුණුමේ නියමයන් යටතේ සහ ඒ ප්‍රකාරව එකඟ වූ ප්‍රමාණයට සහ බලපවත්වන සීමාව තෙක් හැර එච්ඩීඑල් සමාගමේ සාංගමික ව්‍යවස්ථා වලින් 79 වන, 127 වන හා 129 වන ව්‍යවස්ථා යටතේ මිට්සුයි සහ තායිසේ සමාගම් වලට ලබා දී ඇති කිසිදු අයිතිවාසිකමක් එම සමාගම් විසින් ක්‍රියාත්මක නොකළ යුතුය."

(ඈ) (i) එකී පරිශිෂ්ටයෙහි පහත දැක්වෙන අංක. 5 දරණ වගන්තිය ඇතුළත්ව ඇති බව ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

> "5. ඉහත කී අංක. 1 දරණ ගිවිසුමේ 19 වන වගන්තිය ද, ඉහත කී අංක. 3 දරණ ගිවිසුමේ අංක. 5 දරණ වගන්තිය ද, ඉහත කී අංක. 4 දරණ ගිවිසුමේ අංක. 12 දරණ වගන්තිය ද, මෙයින් ඒවායින් බැහැර කරනු ලැබේ."

(ii) එකී පරිශිෂ්ටය මගින්, එකී සමථ ගිවිසුම් වලින් බැහැර කරනු ලැබූ එකම වැදගත් කොන්දේසිය නම්, එවකට එහි සාමාජිකයකු වශයෙන් ඔබද, ඇතුළත් වූ සෙක් ආයතනයේ සාමාජිකයන්ට විරුද්ධව කටයුතු කිරීමට රජය විසින් ගැනීමට තිබූ ක්‍රියාවන්ට අදාළ (මෙහි පහත දැක්වෙන) අංක. 3 දරණ ගිවිසුමේ අංක. 5 දරණ වගන්තිය පමණක් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම් ඒ කෙසේද ?

> "5. එච්චීච්ල් සමාගමට අදාළ කාරණා සම්බන්ධයෙන් අමරසේකර මහතා විසින් එකී ආයතන වෙත කරන ලද නියෝජිතයන්ට අදාළව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ/හෝ ඒ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සහ කොළඹ කොටස් වෙළඳපොළේ සහ/හෝ එහි අධ්‍යක්ෂවරයන්ගේ ක්‍රියාකලාපය හා ක්‍රියාවන් සම්බන්ධයෙන් රජය විසින් නිසි සහ ස්වාධීන ක්‍රියා මාර්ගයක් ගත යුතු අතර, එකී කාරණා සම්බන්ධයෙන් දිගටම ක්‍රියා කරගෙන යාමේ අයිතිය අමරසේකර මහතා විසින් තමා වෙත ද, රඳවා තබාගනු ඇත."

(iii)/

(iii) ඉහත කී කොන්දේසිය බැහැර කිරීමට පැමිණිලිකරු එකඟ වූයේ, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් සියල්ලන්ම ඔබගේ විෂය පථය යටතට වැටෙන වත්මන් නීතිපතිවරයා වූ, ජනාධිපති නීතිඥ සරත් සිල්වා මහතාගේ, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් වූ බී.සී.පෙරේරා මහතාගේ සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මහතාගේ දැඩි ඉල්ලීම මත බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒ කෙසේ ද?

(iv) එකී සමථ ගිවිසුම් වලින් මේ හා සමානව බැහැර කරන ලද අනිත් කොන්දේසි දෙක නම් (පහත දැක්වෙන පරිදි) අංක.1 දරණ සමථ ගිවිසුමේ අංක.19 දරණ වගන්තිය සහ අංක.4 දරණ සමථ ගිවිසුමේ අංක.12 දරණ වගන්තිය පමණක් බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

> "19. සමථයට එළඹීම මත සහ කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ නඩුව ඉල්ලා අස්කර ගැනීම මත, මෙහි මින් ඉහත සඳහන් කළ 1 - 5 දක්වා වූ වගන්ති ද, 9 සහ 11 දරණ වගන්ති ද, ක්‍රියාත්මක වී බලාත්මක වීම සිදුවනු ඇත. එසේ වුවද, කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරණ නඩුව, 1996 මැයි මස 31 වන දින වන විට නිරවුල් කර ඉල්ලා අස්කර ගනු නොලැබුවහොත්, 1996 ජුනි මස 08 වන දිනට පසු ඕනෑම අවස්ථාවක කාලය ඉකුත් විය හැකිවන පරිදි, රජයට සහ එච්ඩීඑල් සමාගමට දින 7 ට අඩු නොවන කාලයක නොතීසියක් දීමෙන්, මෙම ගිවිසුමේ ඉතිරි වගන්ති බලාත්මක වීම සහ ක්‍රියාත්මක වීම සිදු නොවන බවට මිට්සුයි සහ නායිසේ සමාගම් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. එවිට, මේ ගිවිසුමේ ඉතිරි වගන්ති ශූන්‍ය හා බලරහිත බවට පත්වන අතර, ඒවා සම්බන්ධයෙන් කිසිදු පාර්ශවයකට අනිත් පාර්ශවකරුවන්ට එරෙහිව කිසිම ඉල්ලීමක් කරනු නොලැබිය හැකිය."

"12. මීට/

"12. මීට අමුණා ඇති 'ඒ' දරණ ඇමුණුමේ සඳහන් කර ඇති පරිදි, කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දරණ නඩුවේදී මෝසම් මත නියෝගයක් 1996 මැයි මස 31 වන දින වන විට නිකුත් කරනු නොලැබුවේ නම්, 1996 ජූනි මස 08 වන දිනට පසු ඕනෑම අවස්ථාවක කාලය ඉකුත් විය හැකි වන පරිදි, අමරසේකර මහතාට සහ එච්ඩීඑල් සමාගමට දින 7 ට අඩු නොවන කාලයක නොතීසියක් දීමෙන්, ඒ දිනය වන විට, ක්‍රියාත්මක කර නොමැති මෙම ලියවිල්ලේ වගන්ති බලාත්මක වීම සහ ක්‍රියාත්මක වීම සිදු නොවන බවට මිට්සුයි සහ තායිසේ සමාගම් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය. එවිට, මේ ගිවිසුමේ ඉතිරි වගන්ති ශූන්‍ය හා බලරහිත බවට පත්වන අතර, ඒවා සම්බන්ධයෙන් කිසිදු පාර්ශවයකට අනිත් පාර්ශවකරුවන්ට එරෙහිව කිසිම ඉල්ලීමක් කරනු නොලැබිය හැකිය."

(v) ඉහත කී වගන්ති දෙක බැහැර කිරීම නිසා, සමථ ගිවිසුම්වල සියලු කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා 1996 මැයි මස 31 වන දිනට වූ අවසාන දිනය, දින නියමයක් නැතිව දීර්ඝ කිරීමක් සිදුව ඇති බව ඔබ පිළිනොගන්නෙහිද ? එසේ නොවේ නම්, එයින් සිදුව ඇත්තේ කුමක්ද ?

(ඉ) පරිශිෂ්ටය සහ ඒ පරිශිෂ්ටය යටතේ ජපන් සමාගම් (මිට්සුයි සහ තායිසේ) විසින් දෙන ලද වෙනස් කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය යටතේ සහ ඒවායේ නියමයන් පරිදි, ඉහත විචාරණ අංක.15(ඈ)(ii) හී සඳහන් කරන ලද එක කොන්දේසියක් හැර, 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක.1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම්වල සියලු කොන්දේසි ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට රජය එකඟ වූ බව සහ පොරොන්දු වූ බව ඔබ පිළිනොගන්නෙහිද ?

(ඊ)/

(ඒ) 1996 ඔක්තෝබරයේදී එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව, 1995 අගෝස්තු මස 08 වන දින ඔබ විසින් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයෙහි රජයට පිළිගත නොහැකි එක් කොන්දේසියක් ලෙස ඔබ විසින් හඳුන්වනු ලැබූ අංක.3 දරණ සමථ ගිවිසුමේ ඒ කොන්දේසිය ම 1996 සැප්තැම්බර්/ඔක්තෝබර් මාසයේදී නීතිපතිවරයා විසින් බලාත්මක කොට ක්‍රියාත්මක කරන ලද බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද?

(ඓ) අංක.3 සමථ ගිවිසුමේ කොන්දේසි වලට අනුකූලව, එච්ඩීඑල් සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා ඉවත් කිරීමට යෙදුණු බවත්, අළුත් සභාපතිවරයකු පත්කර ගැනීමට යෙදුණු බවත්, කළමනාකාර - අධ්‍යක්ෂවරයාගේ කාර්‍යභාර තාවකාලිකව ආවරණය කිරීම පිණිස වැඩ පිළිවෙලක් සකස් කළ බවත්, එසේම, අංක.3 හා 4 සමථ ගිවිසුම්වල කොන්දේසි වලට අනුව, එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමට යෙදුණු බවත්, ඔබ පිළිනොගන්නෙහිද ? එසේ නොවේ නම්, එසේ නොවන්නේ ඇයි?

(ඔ) (i) අංක.3 දරණ සමථ ගිවිසුම යටතේ වූ ස්වකීය කාර්යභාරය රජය විසින් නිසිලෙස අනුගමනය කරමින් සහ ඉටු කරමින්, එකී අංක.1 හා අංක.4 දරණ සමථ ගිවිසුම්වල කොන්දේසි ගණනාවක් ක්‍රියාත්මක කිරීම පිණිස හා බලාත්මක කිරීම පිණිස යෝජනා සම්මත කර ගැනීමට දැන්වීමක් කරමින් එවකට භාණ්ඩාගාරයේ ලේකම්වරයා වූ බී.සී.පෙරේරා මහතා විසින්, 1996 දෙසැම්බර් මස 12 වන දින පවත්වන්නට යෙදුන, එච්ඩීඑල් සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක්, කැඳවමින් අධියාචනයක් යැවූ බවත්, ඒ යෝජනා සම්මතයන් සම්මත කර ගැනීම, අධිකරණයේ තීරණය ලැබෙන තෙක් නිම නොවී පවතින බවත්, ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

(ii) එවකට භාණ්ඩාගාරයේ ලේකම්වරයා වූ බී.සී.පෙරේරා මහතා විසින්, 1998 ජනවාරි මස 21 වන දින පැවැත් වූ එච්ඩීඑල් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී, එච්ඩීඑල් සමාගමේ විගණකවරුන් වන ෆෙර්ඩ් රෝඩ්ස් තෝර්න්ටන් සහ සමාගම එම ධූරයෙන් ඉවත් කිරීමටත්, අංක.3 දරණ සමථ ගිවිසුමේ තත් කාර්යය සඳහා වූ කොන්දේසි රජය විසින් නිසිලෙස අනුගමනය කරමින් හා ඉටු කරමින් 1990 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂයේ එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් නැවත සකස් කිරීමට හා අවසන් කිරීමටත් දැන්වීම් කර යෝජනා සම්මතයන් යෝජනා කර සිටි බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද ?

(එ) (i) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ හිල්ටන් සමථ ගිවිසුම් රජය විසින් අත්හිටවීමේ නෛතික පදනම ජපන් රජයේ බලධාරීන් විසින් ප්‍රශ්ණ කිරීමට යෙදුණු බව ඔබ පිළිනොගන්නෙහිද ?

(ii) රජයේ නියෝජිත කණ්ඩායමක් ඔබගේ නායකත්වයෙන් ඔබ විසින් මෙහෙයවනු ලැබූ 1996 ඔක්තෝබර්/නොවැම්බර් වලදී පැවැත් වූ පැරිස් ආධාර කණ්ඩායමේ රැස්වීමේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 245 ක පමණ වූ ජපන් ණය මුදලක් ලබා ගැනීම සාර්ථක ලෙස රජයට සාකච්ඡා කිරීමට හැකිවනු පිණිස, හිල්ටන් සමථ ගිවිසුම් 1996 ඔක්තෝබර් මාසයේදී ක්‍රියාත්මක කළ යුතුව තිබුණු බව ඔබ පිළිනොගන්නෙහිද ?

(iii) එසේ නැතිනම්, එම සමථ ගිවිසුම් එතරම් හදිසිව ඉතා ඕනෑකමින් 1996 ඔක්තෝබර් මාසයේදී ක්‍රියාත්මක කළේ මන්ද?

(ඒ) (i) ඔබ විසින් නීති විරෝධී ලෙස සිදු කරන ලද හිල්ටන් සමථ ගිවිසුම් අත්හිටවීම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන්, නීතිපතිවරයා විසින් අනුමත කරන ලද පරිදි වූ ප්‍රකාශයක් සහ කලින් ඇතිකර තිබෙන වැරදි අවබෝධ නිවැරදි කරමින් අදාළ කරුණු පිළිබඳව සත්‍ය හා නිවැරදි ප්‍රකාශයක් 1996 දෙසැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කරන විට පාර්ලිමේන්තුවට කරන ලෙස ඔබට නියම කර තිබූ බව ඔබ පිළිනොගන්නේද?

(ii) ඔබ හිතාමතාම එසේ කිරීම පැහැර හැරිය බව සහ නොසලකා හැරිය බව ඔබ පිළිනොගන්නේද? එසේ නම්, ඒ ඇයි?

(ඔ) (i) එච්ඩීඑල් සමාගමේ සභාපති සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් බී.වයි.ලියනගේ මහතා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂ පී.බී.ජයසුන්දර මහතා, විසින් අත්සන් කරන ලද්දා වූද, එච්ඩීඑල් සමාගමේ ලේකම්වරුන් විසින් 1997 නොවැම්බර් මස 07 වන දින සංසරණය කිරීමට සලස්වන ලද්දා වූද, එච්ඩීඑල් සමාගමේ ත්‍රෛමාසික ගිණුම් වලින්, ප්‍රමාදය සඳහා පොලිය වශයෙන් එච්ඩීඑල් සමාගම විසින් ජපන් යෙන් 156,478,693 ක (ශ්‍රී ලංකා රු.79,629,171/- ක) අතිරේක මුදලක් ගෙවා ඇති බැව් අනාවරණය වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද ? එසේ නම්, ඒ කෙසේද ?

(ii) එච්ඩීඑල් සමාගමට ගෙවන්නට සිදු වූ එකී අතිරේක පොලිය එසේ දරන්නට සිදු වූයේ හිල්ටන් සමථය නීතිවිරෝධී ලෙස අත්හිටවීම නිසා බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

(ඕ) /

(ඕ) (i) හිල්ටන් සමථය නීති විරෝධී ලෙස අත්හිටවීම නිසා, පැමිණිලිකරු විසින් තත් කාර්ය සඳහා විශේෂිතවම සාකච්ඡා කොට ලබාගත් ඉතිරි ණය මුදල ආපසු ගෙවීම උදෙසා වූ එක් අවුරුදු ක්ෂමා කාලසීමාව තුළදී, අංක.2 දරණ සමථ ගිවිසුමේ 13 වන හා 14 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි, එච්ඩීඑල් සමාගමේ මූල්‍ය කටයුතු තවදුරටත් ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ඔබ පිළිනොගන්නෙහිද ? එසේ නොවේ නම්, ඒ ඇයි ?

(ii) එච්ඩීඑල් සමාගමේ ඉහත කී ත්‍රෛමාසික ගිණුම් වලින්, 1997 ජූලි මස 01 වන දින ජපන් සමාගම් වලට (මිට්සුයි හා තායිසේ) ගෙවීම් කිරීම පිණිස එච්ඩීඑල් සමාගම වෙනුවෙන්, රු.288,567,634 ක අතිවිශාල මුදලක් රජයට ගෙවීමට සිදු වූ බව ඔබ ප්‍රතික්ෂේප කරන්නේද ? එසේ නම්, ඒ කෙසේද ?

(iii) ඉහත සඳහන් කරන ලද පරිදි, මහජන මුදල් භාවිතා කරමින් එවැනි අතිවිශාල මුදල් සම්භාරයක් රජයට ගෙවන්නට සිදු වූයේ හිල්ටන් සමථය නීති විරෝධී ලෙස අත්හිටවීම නිසා බවත්, එසේ අත්හිටවීම නිසා ඉහත සඳහන් කරන ලද පරිදි, එච්ඩීඑල් සමාගමේ මූල්‍ය කටයුතු තවදුරටත් ප්‍රතිව්‍යුහකරණය වළක්වන ලද බවත්, ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

(iv) සඳහන් කරන ලද අවස්ථාගත කරුණු අනුව, එච්ඩීඑල් සමාගමට/රජයට එලෙස අලාභ සිදු කිරීම, 1994 අංක.20 දරණ අල්ලස් (සංශෝධන) පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති "දූෂණය" යන්නෙහි අර්ථය තුළට වැටෙන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ?

<u>උත්තරයේ 39 වන හා 40 වන ඡේදවල සම්ප්‍රකාශ වලට අදාළව</u> :

16. (අ) 1995 ජුලි මස 25 වන දින එකී ඩේලි නිවුස් පත්‍රයේ වාර්තාවට අනුව, ජනාධිපති චන්ද්‍රිකා කුමාරණතුංග මැතිණිය මුදල් අමාත්‍යවරියගේ තත්ත්වයෙන් ක්‍රියාකර ඇති බව ඔබ විසින් සඳහන් කර ඇති බව ඔබ පිළිගන්නේද ? එසේ නොවේ නම්, එහි සඳහන් කර ඇත්තේ කුමක්ද ?

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 35(i) වන ව්‍යවස්ථාව යටතේ සහ එහි නියමයන් ප්‍රකාරව, ජනාධිපතිවරයා වෙත පැවරී ඇති අයිතිවාසිකම් හා වරප්‍රසාද, එකී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 35(3) වන ව්‍යවස්ථාව පරිදි, අමාත්‍යවරයකුගේ විෂයයකට හෝ කාර්යයකට අදාළ වූ කිසියම් බලතල ක්‍රියාත්මක කිරීමක් සම්බන්ධයෙන් වූ ජනාධිපතිවරයාගේ ක්‍රියාකලාපයට සහ ක්‍රියාවලට අදාළ නොවන බව ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම් ඒ කෙසේද ?

<u>පැමිණිල්ලේ සහ උත්තරයේ සඳහන් වන හිල්ටන් සමට් ගිවිසුම් වලට අදාළව</u> :

17. (අ) හිල්ටන් සමට්ය පිළිබඳ ඔබගේ ඉහත කී ප්‍රකාශ කිරීමට ප්‍රථම, මුදල් අමාත්‍යාංශයේ ලිපි ගොනුවල ඇති කාරණයට අදාළ සියලු ලියකියවිලි හා ලේඛන ඔබ විසින් පිරික්සා බලා දැනගත යුතුව තිබුණු බව දැනගත යුතු බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒ ඇයි ?

(ආ) පහත දැක්වෙන කරුණු ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිද ? එසේ නම්, ඒ කෙසේද ?

(i) ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 1990 දෙසැම්බර් මස 17 වන දින, වෙනත් දේවල් අතර, පහත දැක්වෙන ලෙස සඳහන් කරමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යැවූ බව ;

"තමත්/

"තවත් කරුණක් නම්, ප්‍රෝඩාවක් සිදු වී ඇති බවට දිසා අධිකරණයේ ඇති නඩුවේදී නිගමනයකට එළඹුනහොත්, රජයට බහුතර කොටස් සංඛ්‍යාවක් තිබෙන සමාගම විසින් ම නීති කටයුතු ආරම්භ නොකළේ මන්ද යන ප්‍රශ්ණය අසනු ඇත. තවත් එවැනි ප්‍රශ්ණයක් විය හැක්කේ, අධිකරණයෙහි නඩුවක් පැවරූ විට, එම කාරණය සම්බන්ධයෙන් නඩු මහට බැසීමට, ස්වකීය කොටස්හිමියන් සහ මහජනතාව සම්බන්ධයෙන් සැලකීමේදී සමාගමට මූලික වගකීමක් තිබියදී, සමාගම නිශ්ශබ්දව සිටියේ කුමක් නිසාද යන ප්‍රශ්ණයයි. ප්‍රෝඩාකාරී ගනුදෙනුවක් සඳහා මුදල් ගෙවීම පිණිස මහජන මුදල් යොදා ගැනීම වැළැක්වීම පිණිස පියවර ගැනීම, සුළු කොටස්හිමියකුට කරන්නට ඉඩ හැරියේ කුමක් නිසාද යන ප්‍රශ්ණය, මෙයින් පැන නගින තවත් ප්‍රශ්ණයක් වශයෙන් ඇසිය හැකිය. ජපන් සමාගම් විසින් රජයේ ඇපවීම් ඉල්ලා සිටියහොත්, එහි ප්‍රතිඵලය මෙය විය හැකිය".

"මේ කාරණය සම්බන්ධයෙන් ජපන් රජයේ හැඟීම් පිළිබඳව, ජපන් සමාගම් සහ ප්‍රසිද්ධ පුද්ගලයන් පටලැවුණු ප්‍රෝඩාවන් කෙරෙහි ජපන් මහජනතාව තුළ දැඩි ආන්දෝලනයක් මැඬෙමින් පවතින බව පෙන්වා දී ඇත. එබැවින් ජපන් සමාගම් සම්බන්ධවන විදේශයන්හි සිදුවන ප්‍රෝඩාවන් කෙරෙහි කිසිදු ජපන් රජයකින් ලිහිලක් දක්වනු ඇතැයි බලාපොරොත්තු විය නොහැක".

(ii) කොළඹ දිසා අධිකරණයේ අංක. 3155/විශේෂ දරණ පැමිණිලිකරුගේ ව්‍යුත්පන්න නඩුවේදී වැරදි කළ තැනැත්තකු වශයෙන් නම් කළ, පාර්ලිමේන්තු මන්ත්‍රී, ජනාධිපති නීතිඥ කේ.එන්.චොක්සි මහතා, දැඩි බලපෑම් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සිටියදී, පැමිණිලිකරුගේ එකී නීති කෘත්‍යය සම්බන්ධයෙන් සහ ඉන් අනතුරුව, හිල්ටන් සමථය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ කටයුතු වලට මැදිහත් වී ඇති බව ;

(iii)/

(iii) හිල්ටන් සමථ සාකච්ඡා 1992 දී ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නිළ කාලය තුළ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්/නිළධාරීන්, නීතිපති/ඔහුගේ නිළධාරීන් සහ පැමිණිලිකරු/ඔහුගේ නීති උපදේශකයන් අතර ආරම්භ වූ බව ;

(iv) සමථයේ නියමයන්, 1995 ජූනි මස 28 වන දින එළඹෙන ලද සමථ ගිවිසුම්වල ඇතුළත් සියලු කොන්දේසි පිළිබඳව නීතිපතිවරයා/ඔහුගේ නිළධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්/ඔහුගේ නිළධාරීන් ඉදිරිපිට දී 1992 දී එකඟ වූ බව ;

(v) ගිවිසගත් සමථ නියමවල පදනම මත පසුව 1993 දී නීතිපතිවරයා විසින් සමථ ගිවිසුම්වල කටයුතු සමාප්ත කළ බව ;

(vi) පසුව 1994 ජූනි වලදී, නීතිපතිවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරුණු පැහැදිලි කර දීමෙන් පසු විජේතුංග ජනාධිපතිතුමා විසින් සමථ ගිවිසුම් අනුමත කිරීමට යෙදුණු බව සහ ඒවා ක්‍රියාවේ යොදන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට හෝ ඔහු නොමැති නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට අධිකාරය හා බලය දුන් බව ;

(vii) එච්ඕඑල් සමාගම ණයකරු වූයේ වී නමුදු, ඇපකරු වශයෙන් සිටින ශ්‍රී ලංකා රජයෙන් පොරොන්දු නෝට්ටු ලබා ගැනීමට ජපන් සමාගම් (මිට්සුයි/තායිසෙයි) විසින් බලකර ඉල්ලා සිටීමේ කොන්දේසිය නිසා පැමිණිලිකරු සමථ ගිවිසුම් ක්‍රියාවේ යෙදවීමට ප්‍රතික්ෂේප කළ බැවින්, එකී සමථ ගිවිසුමේ අවශ්‍ය කරන ලෙසින්ම ක්‍රියාවේ නොයෙදූ බව ;

(viii) අනතුරුව ජපන් සමාගම් (මිට්සුයි/තායිසෙයි) කොන්දේසිය සම්බන්ධයෙන් කණගාටු වූ බැවින්, එච්ඕඑල් සමාගමේ මූල්‍ය කටයුතු ප්‍රතිව්‍යුහකරණය කිරීමට/එකී සමාගම විසින් ණය මුදල ආපසු ගෙවීම පහසු කරවමින් එහි ණය ප්‍රතිලේඛනගත කිරීමට යටත්ව, කලින් කටයුතු සමාප්ත කර තිබුණු සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කරගෙන යන ලෙස, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1994 ඔක්තෝබරයේදී නීතිපතිවරයා වෙත ලියා යවන ලද බව ;

(ix)/

(ix) 1995 ජූනි මස 28 වන දින ඇතුළත් වූ අංක. 1 සිට 4 දක්වා වූ සමථ ගිවිසුම් එලෙස කටයුතු අවසන් කර ඇති බව ;

උත්තරයේ 4 වන ඡේදයේ සම්ප්‍රකාශ සම්බන්ධව :

18. (අ) මේ නඩුව සම්බන්ධව පුවත්පත් කිහිපයක් විසින් දෙන ලද ප්‍රසිද්ධිය ගැන පැමිණිලි කරන අතරම, ඔබ විසින් සිදු විමට සලස්වන ලද හිල්ටන් සමථය පිළිබඳ එකී නීති විරෝධී අත්හිටවීම ගැන සන්නිවේදන මාධ්‍යයන්හී පුළුල් ප්‍රචාරයක් ඇති කරන ලද්දේ ඔබ විසින්ම සහ ඔබගේ නිළධාරීන් විසින් ම බව සහ රජයට විරුද්ධව කොළඹ දිසා අධිකරණයෙහි ගෙනෙන ලද සිවිල් නඩුවකදී එවකට සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඒ.එස්.ජයවර්ධන මහතා විසින් අධිකරණයෙහි ගොනු කරන ලද දිවුරුම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඔබ විසින් ඔහු ලජ්ජාවට පත් කරන ලද බව ඔබ පිළිනොගන්නෙහිද ? නොඑසේ නම්, ඒ ඇයි ?

(ආ) එවැනි අවස්ථාගත කරුණු වලදී, මහජනයාට බලපාන කාරණයක් සම්බන්ධයෙන් පොදු යහපත අරභයා, සත්‍ය හා නිවැරදි කරුණු හෙළිදරව් කිරීමට, තවද විශේෂයෙන්ම, ඔබ, අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වන විට, ප්‍රවෘත්ති පතු වෘත්තීයමය යුතුකමකින් බන්ධනය වී සිටින බව ඔබ පිළිනොගන්නෙහිද ? පිළිනොගන්නෙහි නම්, ඒ ඇයි ?

වර්ෂ 1998 ක්වූ පෙබරවාරි මස 23 වෙනි දින දීය.

(signature)

පැමිණිලිකරුගේ නීතිඥවරුන්.